# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

## METH SAVIYA NEWS LETTER

❖ සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව ❖ 2008 ජනවාරි ❖ මෙත් සවිය පස්වන කාණ්ඩය ❖ දහවන කලාපය




අති ගරු ජනාධිපති තුමා හමුවීම


කඳුබොඩ සුමතිපාල අනුස්මරණ ආරණ්‍යයේ දී


මිරිසවැටිය චෛත්‍ය රාජයානන් වහන්සේ


අග්‍රාමාත්‍යතුමන් හමු වීම

නිතින් මෙත් සිතින් මම් වෙසෙම් වා!
ගතින් මෙන් සිතින් රෝ මුදම් වා!
බැතින් තුන් රුවන් ඔප නගම් වා!
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා!

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06
දුක: 0714 014467 දුක/ෆැක්ස්: 011 2505088 වෙබ් අඩවිය: www.methsaviya.org විද්‍යුත් තැපැල: office@methsaviya.org







අතිගරු ජනාධිපතිතුමන් සහ අගමැතිතුමන් හමුවූ අප සභාපතිතුමන්, මෙත්සවිය ගරු සාමාජික අරිසෙන් අහුබුදු ශූරීන් සමග සත්ව හිංසනය වැලැක්විම පිලිබඳව නිතිමය පියවරක් ඉල්ලාසිටිමේ ලියවිල්ල බාරදුන් අවස්ථාවන්.











සත්ව හිංසනය වැලැක්විමෙ පලමු පියවරට **2006** වෙසක් පුන් පෝහෝ දින අත්සාන් තැබු අයුරු.

# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්‍රිකා පාර, කොළඹ - 06
දු.ක: 0714 014467 දුක/ෆැක්ස්: 011 2505088 වෙබ් අඩවිය: www.methsaviya.org විද්‍යුත් තැපෑල: office@methsaviya.org

### අප ගැන වචනයක්.....

මෙත් සවිය සංසදය නිරවුල් මනසක් ඇති වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලාංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් අරඹන ලද සාමාජිකයන්ගේ එකතුවකි. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයන් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මෙමගින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයන්ගේ කැමැත්ත/ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත් වන අන්දම, කාල කළමණාකරණය, නායකත්වය ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන් වැනි ඒ ඒ කාල වලදී පවත්වන වැඩසටහන් සඳහා සහභාගී වීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයන්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයන්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක් දන-ශීල-භාවනා වැඩසටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරණ විධායක කමිටු හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයන් මාංශ භක්ෂණයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

මෙත්සවිය තොරතුරු විමර්ශනය කරණවිට පරිපාලන නිලධාරී මහතා අමතන්න ( 0112505088, 0714-014467). සංසදයේ සභාපති ආචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක (0714 800800 හෝ 0777 309385) මගින් දහවල් 12.00 - 1.00ත් අතර හෝ රාත්‍රි 9.00 - 10.00 ත් අතර පමනක් සිදුකරන්න.

**මෙත් සවිය - විධායක කමිටුව 2007**

**ගරු අනුශාසකවරු**
ශ්‍රී විනයාචාර්ය ශ්‍රී ධර්ම රක්ෂිත
වංසාලංකාර අතිපූජ්‍ය
අහංගම ආනන්ද ස්වාමීන් වහන්සේ

අතිපූජ්‍ය
මඩවල උපාලි ස්වාමීන් වහන්සේ

**ගරු සභාපති**
විශ්වවිද්‍යා අධිමනෝවිද්‍යාවේදී
සාශන දීපන, විද්‍යාකීර්ති
ආචාර්ය චන්දන ජයරත්න මහතා

**ගරු උප සභාපතිවරු**
සරත් ඉලංගන්තිලක මහතා
නිහාල් මෙන්ඩිස් මහතා

**ගරු සම ලේකම්වරු**
තුසිත දෙඹගොඩ මහතා
චමින්ද බලවෙදගේ මහතා

**ගරු භාණ්ඩාගාරික**
වාසනා රණසිංහ මහතා

**ගරු උප භාණ්ඩාගාරික**
රොෂාන් ඉන්දු මහතා

**ගරු කාරක සභිකවරු**
භාලක එදිරිසිංහ මහතා
පී.සූරියආරච්චි මහතා
සුසන්ත යාපා මහතා
රංජිත් සොයිසා මහතා

**සංස්කාරක**
සෙනරත් බණ්ඩාර බුළුමුල්ල මහතා

**පරිගනක සංස්කාරක සහ වෙබ් අඩවි කළමණාකරු**
චමිල ප්‍රසන්න මහතා

## සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

### මිලඟ චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන

මිලඟ චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන පැවැත්වීම හා නව සාමාජිකයන් බඳවා ගැනීම සඳහා සාමාජික අයදුම්පත් බාර ගැනීම 2007 පෙබරවාරි 20දක්වා සිදුකෙරේ. අයදුම්පත් සගරාවේ ඇතුල්පිටුවෙන් හෝ මෙත් සවිය වෙබ් අඩවියෙන් (www.methsaviya.org) ලබාගත හැක. කල්වේලා ඇතිව අයදුම්පත් එවීමෙන් තෝරාගැනීම සඳහා වන අපහසුතාවයන් මගහරවා ගත හැකි වනු ඇත.

### නොමිළයේ පැවැත්වෙන අක්ෂි සායනය සහ ඇස්කණ්නාඩි ලබාදීම.

2008.01.27 ඉරු දින පෙ.ව. 9.30 සිට ප.ව 2.30 දක්වා (මෙත්සවිය මෛත්‍රී සංසදය ඇති ශ්‍රී විජයාරාමයේ දී, කොළඹ-6) අක්ෂි සායනයක් සහ අවශ්‍ය අයට නොමිලේ ඇස්කණ්නාඩි 100 ලබාදීම සිදුකෙරේ. මෙත්සවිය සාමාජිකයන්ට සහ එම පවුල්වල අයටත්,සාමාජිකයි දන්නා හඳුනන අඩු ආදයම් ලබන අසල්වාසීන් හටත් මෙම සායනයට පැමිණ ඇස් පරීක්ෂා කරවාගෙන ඇස්කණ්නාඩි ලබාගැනීමට අවස්ථාව ඇත.නුගේගොඩ අනුලා විදුහල ඉදිරිපිට ඇති සයිට් එන් ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස් හි අධිපතිනි මෙත්සවිය සාමාජිකා දාෂ්ඨි විශේෂඥ හෙරංජලා කන්නන්ගර මහත්මිය මෙහිදී ඇස් පරීක්ෂා කර බලනු ඇත. ඇස්කණ්නාඩි 100 ක් නොමිලේ ලබාදීමේ මහා පුණ්‍යකර්මය මෙත්සවිය සාමාජිකා ශානිකා නිලූෂා මෙහවියගේ දෙමව්පියන් විසින් සිදුකෙරේ.

### තෙවන වාර්ෂික මහා සභා රැස්වීම 2008 ජනවාරි 06 වෙනි ඉරුදින පැවැත්වේ

අප මෙත්සවිය මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදයේ, තෙවන වාර්ෂික මහා සභා රැස්වීම 2008 ජනවාරි 06 වෙනි ඉරුදින ප.ව. 2.00 ට කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ පිහිටි ධර්ම ගවේශී බෞද්ධ ආශ්‍රමයේදී පැවැත්වෙන බව මෙයින් දන්වා සිටිමු. මෙතෙක් සාමාජිකත්වය අලුත් නොකර ඇති සියළුම දෙනා වාර්ෂික මහා සභා රැස්වීමට ප්‍රථම සාමාජිකත්වය අලුත් කරගන්නා ලෙස ඉල්ලා සිටිමු. අප සංසදය මගින් නිකුත් කරනු ලබන දින දර්ශනය මෙදින සාමාජිකයන් අතර බෙදදෙන බව ද දන්වා සිටිමු.එදින වැඩ සටහන් අතර විශේෂ ධර්ම දේශනය, රූපවාහිනී වැඩසටහන් වලින් නිතර පෙනී සිටින, කඳුබඩ ජාත්‍යන්තර භාවනා මධ්‍යස්ථානාධිකාරි කර්මස්ථානාචාර්ය විනයාචාර්ය ධර්ම ග්‍රන්ථ විශාරද විචිත්‍රභානි දියසෙන්පුර විමල ස්වාමීන්ද්‍රයන් වහන්සේ ධර්ම දේශනාව පවත්වනු ලැබේ.

### 2008 ජනවාරි 01 දින වසරේ ප්‍රථම හීල් දනය

2008 ජනවාරි 01 දින කොළඹ 02 හුණුපිටියේ ගංගාරාම විහාරස්ථානයේදී වර්ෂය ආරම්භ කිරීම නිමිති කොට ගෙන පවත්වනු ලබන හීල් දනමය පුන්‍යකර්මය එදින කේෂධාතූන් වහන්සේ වෙත බුද්ධ පූජාව සහ මහා සංඝ රත්නය විෂයෙහි හීල් දනය පිංකම සාමාජික සාමාජික සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විය.

### මෙත් සිතින් කරන දැනුම් දීමක්

ඉදිරි කාලයේ දී මෙත් සවිය මගින් පවත්වනු ලබන දන-සීල-භාවනා සහ වෙනත් පුණ්‍ය කටයුතු වලදී ඒවාට සහභාගීවන්නා වූ සමාජික සමාජිකාවන් කිසිම හේතුවක් නිසා හෝ බිම එලා ඉඳගැන්මට සහ තමන්ගේ බඩු බාහිර ආදිය ගෙන යාමට, පොලිතින් උර හෝ පොලිතින් කොල භාවිතා නොකළ යුතු වන්නේය.මේවායින් නැගෙන හඬ නිසා භාවනාවට බාධා ඇතිවී තිබේ. පසු ගිය කාල වලදී සිදුවූ යම් යම් අපහසුතාවයන් මෙන්ම නොයෙක් දෙනාගේ ඉල්ලීම් ද සැලකිල්ලට ගෙන මෙම පියවර ගැනීමට සිදු වී ඇති බැව් දැනුම් දෙන්නෙමු.

# පුණ්‍යවන්තවූ උත්සාහයේ ජයග්‍රහනයක්...

මෙත් සවිය මඟින් 2550 සම්බුද්ධ ජයන්තිය සැමරීම පිණිස 2006 වෙසක් පුන් පොහෝ දින ඇරඹූ සත්ව හිංසනය වැලැක්වීමේ වැඩ පිලිවෙලට මේ වන විට රාජ්‍ය අනුග්‍රහය හා සංවිධාන රැසක ක්‍රියාකාරී සහයෝගය ලැබී ඇත.

සෑම සත්වයෙකුටම මිහිපිට ජීවත් වීමේ පූර්ණ අයිතිය ඇති අතර එය කිසිවකුට අහිමි කළ නොහැකි විය යුතුය. මේ මතයට පිටුපාමින් තිරිසනුන්ටත් නොගැලපෙන අන්දමින් සත්ව හිංසනය කරමින් ඔවුන් දස දහස් ගණනින් මෙම දහම් දිවයිනේ ඝාතනය වෙමින් පවතී. අප රටේ ආහාර පිණිස දිනකට කුකුළන් පමණක් පන්ලක්ෂය ඉක්මවා මරා දමන බැව්ද වාර්තාවේ.මෙබදු තත්වයක් යටතේ ආහාර පිණිස දිනකට මරාදමන මාළුන් ප්‍රමාණය කොටනම්. ගණන් කළ හැකිද?
නව නීති පනවන තෙක් මෙතෙක් පවත්නා නීති ක්‍රියාත්මක කරවීමේ වැඩපිළිවෙලක් දැන් අරඹා තිබේ. මේ අනුව පොලිසිය මඟින් පහත නීති රැකිය යුතු බව සෑම පොලිසියකටම දන්වා ඇතැයි පොලිස් චක්‍රලේඛනයක සඳහන් ව ඇත.
මෙහි පහත සඳහන් එම නීති රීති කඩවන අයුරින් සත්ව හිංසනය සිදුවන්නේ නම් මෙත් සිතැති ඔබගේ සහයෝගය ඒවා වැලැක්වීම පිණිස ලබා දෙන්න. ළඟම ඇති පොලිසියට දන්වන්න.
තම බල ප්‍රදේශය තුළ පොලිසියට දන්වනවාට අමතරව, මන්දගාමී බවක් තිබේනම් පොලිසියේ අපරාධ අංශයේ පහත දුරකථනයට සොයා බලන ලෙස දැනුම් දෙන්න.

දු.අංකය-2333496

01. 1893 අංක 03 දරණ ගෝඝාතක ආඥා පනත යටතේ විශේෂිත වූ වැරදි

1:1 4 (1) වගන්තිය:-මෙම වගන්තිය ප්‍රකාර නිසි බලධාරියා විසින් දෙන ලද වාර්ෂික හෝ තාවකාලික බල පත්‍රයකින් තොරව කිසිවකු විසින් සතුන් මැරීම මෙන්ම බල පත්‍රයක් රහිතව මස් වෙළඳාම හෝ සිදු නොකල යුතුය.
1:2 13 (අ) වගන්තිය:- මෙම වගන්තිය ප්‍රකාර, පළාත් පාලන භාර අමාත්‍යංශයේ ලේකම් විසින් අනුමත කරන ලද සැලැස්මක් අනුව ඉදිකල ගොඩනැගිල්ලක් නොවන යම් ස්ථානයක යම් සතෙකුගේ මස් විකිණීම හෝ විකිණීමට තැබීම නැතහොත් ඒ සඳහා සැලැස්වීම තහනම් වේ.
1:3 18 (1) වගන්තිය:- නිසි බලධාරියාගෙන් ලබා ගන්නා ලද අවසර පත්‍රයක් නොමැතිව කිසිම ගවයකු ඝාතනය කිරීම නීත්‍යානුකූල නොවනු ඇත.
1:4 19 වගන්තිය:- එබදු අවසර පත්‍රයක් ලබන කිසිවකු එම අවසර පත්‍රය සඳහන් ස්ථානයෙන් හැර අනෙක් කිසිම ස්ථානයක එම නියමය කඩ වන පරිද්දෙන් ගවයින් ඝාතනය නොකල යුතුය.
1:5 14 වගන්තිය:- බල පත්‍රයක් සහිතව සත්වයින් ඝාතනය කල යුත්තේ පෙරවරු 06.00 සිට පස්වරු 06.00 දක්වා කාලය තුලය.ඒ අනුව රාත්‍රී කාලයේ කිසිම සත්වයෙක් ඝාතනය නොකල යුතුය.
1:6 15 වගන්තිය:- නීත්‍යානුකූලව ගවයන් ඝාතනය කිරීමට ප්‍රථම ඊට පැය 24 ක කාලයක් තුළ මහජනතාවට පෙනෙන සේ එම සතා ප්‍රසිද්ධියේ තැබිය යුතුය.
1:7 15 (2) වගන්තිය:- රෝගී වූ කිසිම ගවයකු ඝාතනය කිරීම හෝ එබදු රෝගී ගවයකුගේ මාංශ විකිණීම සඳහා තැබීම කිසිවකු විසින් සිදු නොකල යුතුය.
1:8 24 (1) වගන්තිය:- කිසියම් ගව මාංශයක් හෝ නොවියලි ගවමස් ස්වකීය ස්වාමීත්වයේ තබා ගැනීම හා ඒ පිළිබඳව අධිකරණය සෑහීමට පත් වන අයුරින් විස්තර කීමට අපොහොසත් වන තැනැත්තෙකු ද මෙහිදී වරදක් සිදුකරනු ලැබේ.

2:1 2 වන වගන්තිය:- මෙම වගන්තිය ප්‍රකාර, කුරුල්ලන්, මත්සයන්, උරග වර්ගයේ සතුන් ඇතුලු සියලුම ගෘහස්ත හා අල්ලාගත් සතුන්ට හිංසා කිරීම තහනම් වේ. මෙහිදී සතුන් නිරාහාරව තැබීම, ඔවුන්ට තුවාල වන අයුරින් සිරකර තැබීම, වද හිංසා පැමිණවීම, නොසැලකිලිමත්කම හේතු කොටගෙන සතුන් වේදනාවට පත් කිරීම යනාදිය මෙන්ම එම සතුන්ට අනවශ්‍ය පරිදි වේදනා විඳීමට අවස්ථා සලසා දෙමින් යම් වාහනයකින් රැගෙන යාම එමෙන්ම කූඩයක්, පෙට්ටියක් හෝ කූඩුවක් යනාදිය තුල රැගෙන යාම හා උසුලා ගෙන යාම වරදක් වේ.
2:2 4 වන වගන්තිය:- යම් පුද්ගලයකු අනවශ්‍ය වූත්, කෲර වූත් අයුරින් යම් සතෙකු මැරීම සිදු නොකල යුතුය.

3:1 2 වන වගන්තිය:- මෙම වගන්තිය ප්‍රකාර, පහත විස්තර සඳහන් ගවයකු (පිරිමි සතුන් පමණි) මස් ලබා ගැනීම සඳහා ඝාතනය කල හැක.
i. වයස 12 ට වැඩි වයසකින් යුත් ගවයින්
ii.අන්ධ, අංග විකල වූ හෝ කෘෂිකාර්මික කටයුතු වලට යොදා ගත නොහැකි ගවයින්
iii.බෝවන හෝ අසාධ්‍ය රෝගයකින් මිදුණු ගවයින්
iv. පසුගිය මාස 3 ක කාලයක පටන් එම සත්වයා ජීවත්ව සිටි කිලෝ මීටර 2 ක ප්‍රදේශයක තුල බෝවෙන හෝ ආසාධ්‍ය රෝගයක් පැතිර තිබුණා නම්, එම සත්වයාද ඝාතනය කල නොහැක.
කෙසේ වෙතත් ඉහත තත්වයේ ඇති සතුන් පිලිබඳව සහතිකයක් අදාළ ඝාතක ස්ථානය හා සම්බන්ධ වන පශු වෛද්‍යවරයා විසින් මූලිකව ලබා දෙන අතර, එම සහතිකය නිකුත් කිරීමෙන් අනතුරුව පමණක් එම සතුන් ඝාතනය කල යුතුය.
3:2 2 (2) වගන්තිය:-මෙම වගන්තිය ප්‍රකාර සියලුම එළදෙනුන්, පැටවුන්, (අවු:12 ට අඩු පිරිමි හා ගැහැණු පැටවුන්) සහ සියලුම මී ගවයින් මැරීම, මැරීමට ඉඩ දීම තහනම් වේ.එම ආඥා පනතේම විධි විධානයන්ට අනුකූලව සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, සතුන්ගේ සෞඛ්‍ය හා සම්බන්ධ අධ්‍යක්ෂ වරයාගේ 1983.06.20 වන දිනැතිව ශ්‍රී ලංකාවේ සියළුම පශු වෛද්‍යවරුන්ට ලිඛිතව කර ඇති නියෝගය ප්‍රකාර,පහත සඳහන් සතුන් කුමන හේතුවක් නිසා හෝ ඝාතනය කිරීම සම්පූර්ණයෙන් තහනම් කර ඇත.

i. සියලුම පිරිමි හා ගැහැණු මී ගවයින්
ii. සියලුම එළදෙනුන්
3:3 3 වගන්තිය:-මේ අනුව යම් පරිපාලන දිස්ත්‍රික්කයක් ඇතුළත හෝ පරිපාලන දිස්ත්‍රික්කයක් තුලට හෝ යම් පරිපාලන දිස්ත්‍රික්කයෙන් බැහැරට හෝ යම් සතෙකු ප්‍රවාහනය කිරීම සඳහා පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපති වරයා විසින් නිකුත් කරන ලද ප්‍රවාහන අවසර පත්‍රයක් ලබා ගත යුතු වන අතර, කිසිවකු විසින් ගවයින්, මී ගවයින්, බැටළුවන්, එළුවන්, ඌරන්, කුකුළන්, තාරාවන් වැනි සතුන් එසේ බලපත්‍රයක් නොමැතිව ප්‍රවාහනය නොකල යුතුයි.

4. සතුන් යන වචනය විග්‍රහ කිරීම.
4.1 1892 අංක 03 දරණ ගොඝාතක ආඥා පනතේ 02 වන වගන්තිය ප්‍රකාර, සත්වයා යන්නෙහි හරකුන්, බැටලුවින්, එළුවන්, ඌරන් හා කැස්බෑවන් යන සතුන්ද, ඇතුලත් වේ.

4:2 1907 අංක 13 සත්ව හිංසා පනතේ 14වන වගන්තිය ප්‍රකාර සත්වයා යන්නට කුරුල්ලන්, මත්ස්‍යන් උරග වර්ගයේ සතුන් ඇතුලු ගෘහස්ත සත්වයන් හා අල්ලාගත් සත්වයන් ඇතුලත් වේ.

4:3 1958 අංක 29 සත්ව ආඥා පනතේ 38 වන වගන්තිය ප්‍රකාර සත්වයා යන්නට ගවයින්, මී ගවයින්, බැටලුවන්, එළුවන්, ඌරන් හා කෑම පිණිස ඇතිකරන කුකුලන් හා තාරාවන් ආදි සතුන් ඇතුලත් වේ.

සත්ව හිංසනයක් සිදුවන්නේනම් වහාම ලඟම ඇති පොලිසියට දැනුම් දෙන්න. මීට අමතරව පොලිස් අපරාධ විමර්ශන අංශයේ දු.අංකය-011 2333496 ට ද දැනුම් දිය හැක.

# ඔබේ හදවත තුළත් සොරුන්...

මිනිස් සිත තුළ නිරන්තරයෙන් පදිංචි වී සිටින අපට වින කරන සොරුන් කොටසක් පිළිබඳව තායිලන්ත ජාතික ආචාන් චා හිමියන්ගේ විදර්ශනා භාවනාව නැමැති කෘතියෙන් මනාව පැහැදිලි කර ඇත. මේ එයින් උපුටා ගත් සොරුන් පිළිබඳව ඇති විස්තරයයි. එම සොරුන් පලවා හැරීමට නම් නිරන්තරයෙන් භාවනාව කල යුතු බවත් නොඑසේනම් අපගේ ජීවිත එම සොරුන්ට සින්න වන බවත් උන්වහන්සේගේ අදහසයි.

භාවනාවේ අභිප්‍රාය වනුයේ සැඟවී ඇති ධර්මතාවයන් හෙළිදරව් කර ගනිමින් ඒවා පරීක්ෂාවට භාජනය කර ඒවායේ ඇති හරය අවබෝධ කර ගැනීමයි. උදහරණයක් ලෙසට ගතහොත් අපගේ මෙම ශරීරය යහපත් ලක්ෂණ දෙයක් ලෙස අපි දකිමු. නමුත් බුදුන්වහන්සේ දේශනා කර සිටිනුයේ එය අපවිත්‍ර අස්ථිර, දුකට භාජනය වන දෙයක් වශයෙනි. සත්වයෝ ලෝභය, ද්වේෂය හා මෝහය අත්දකිති.මෙම ක්ලේශයන්ට ගොදුරු වී ඒවායින් ලැබෙන ප්‍රතිඵල නෙලා ගනිති,නරක පැවතීම් වැඩිකර ගනිති, වැඩියෙන් කර්ම රැස්කර ගනිති, නැවතත් ක්ලේශයන්ටම ගොදුරු වෙති. ඔබට ලෝභය, ද්වේශය හා මෝහය යන මේවා සිඳ දැමීමට නොහැකි මන්ද? සිතීම වැරදි නම් ඔබ දුකට භාජනය වන්නෙහිය. නිවැරදි ලෙස අවබෝධ කර ගන්නෙහි නම් දුක කෙලවර කර දැමීමට ඔබට හැකි වන්නෙහිය.

කර්මයේත්, හේතුඵල ධර්මයේත්, ක්‍රියාකාරීත්වය වටහා ගන්න.මෙය දැකගත් බුදුන් වහනසේට ලෝ තුළ පවත්නා සැබෑ උවදුරු වලින් බේරීමට අවශ්‍ය විය. අප ජයගත යුතු වන්නේ අප තුළින්මය. බාහිර උවදුරු අභ්‍යන්තර උවදුරු මෙන් භයානක නොවේ. මෙම අභ්‍යන්තර උවදුරු හා බැඳි මූල ධර්ම මොනවාද?

සුළඟ

මෙය අපේ පසිඳුරන් වෙත එළඹ, පෙළඹවීම, රාගය, තරහව හා නොදැනීම ඇතිකරවීමට හේතු කාරක වෙමින් අප තුළ පවතින යහපත විනාශ කර දමයි. අප සාමාන්‍ය වශයෙන් සුළඟ දකිනුයේ කොළ එහා මෙහා පිඹහැර යවනු ලබන දෙයක් වශයෙනි. තෘෂ්ණාවේ කුණාටු මැවීම සඳහා හේතුවන අපේ ඉන්ද්‍රියන් තුළ පවතින සුළඟ අපි නොදකිමු.

ගින්දර

අපේ ආරාමය කිසි දිනක ගින්නට ගොදුරු නොවූවා විය හැකිය. නමුත් ලෝභ,ද්වේශ,මෝහ යන මේවා විසින් අප නිරතුරුවම දවනු ලබයි. අපේ කටවල් විවර කිරීමටත්, වැරදි ක්‍රියාවල නිරත වීමටත් රාගය හා ද්වේශය හේතුවෙයි. නරක දෙය හොඳ දෙය වශයෙන් ද, අවලක්ෂණ දෙය අලංකාර වශයෙන් ද නොවටිනා දෙය වටිනා වශයෙන් ද දැකීමට මෙම රාගය හා ද්වේශය මග පෙන්වනු ලබයි. භාවනාවේ නොයෙදෙන තැනැත්තා මෙය නොදැක එම ගිනි වලින්ම විනාශ වී යයි.

ජලය

මෙහි පවතින උවදුර නම් අපේ සැබෑ ස්වභාවය යටකර ගෙන අපේ හදවත් තුළ ඇතිවන කෙළෙස් ජලගැලීම යි.

සොරුන්

සැබෑ සොරුන් සිටිනුයේ අපෙන් පිටත නොවේ. අවුරුදු විස්සක් තුළ අපේ ආරාමය සොරුන් දැකගත්තේ එකම එක් වතාවක් පමණකි. නමුත් ඇතුළත සිටින හොර මුල් පහ එනම් පඤ්චස්කන්ධයන් සදාකාලික ලෙස පහර දීමේත්, පැහැර ගැනීමේත් යෙදෙමින් අප විනාශ කර දමනු ලබයි.මේ ස්කන්ධ පහ යනු මොනවාද?

ලෝභ, ද්වේශ, මෝහ යන මේවා විසින් අප නිරතුරුවම දවනු ලබයි. අපේ කටවල් විවර කිරීමටත්, වැරදි ක්‍රියා වල නිරත වීමටත් රාගය හා ද්වේශය හේතු වෙයි. නරක දෙය හොඳ දෙය වශයෙන් ද, අවලක්ෂණ දෙය අලංකාර වශයෙන් ද නොවටිනා දෙය වටිනා වශයෙන් ද දැකීමට මෙම රාගය හා ද්වේශය මග පෙන්වනු ලබයි.භාවනාවේ නොයෙදෙන තැනැත්තා මෙය නොදැක එම ගිනි වලින්ම විනාශ වී යයි.

කය
එය රෝග පීඩාවන්ට හා වේදනාවන්ට ගොදුරකි. අපේ අදහස් වලට එය එකඟ නොවෙන විට අපට දුක හා කණස්සල්ල ඇතිවෙයි. ස්වභාවිකව සිදුවන වයසට යාම හා සිරුරේ දිරාපත් වීම තේරුම් නොගන්නා අප එයින් දුකට පත් වෙමු. අනුන්ගේ සිරුරු කෙරෙහි ආශාවක් හෝ අකමැත්තක් ඇති කර ගනිමින් අපේ සැනසීම නැතිකර ගනිමු.

වේදනා
දුක් හෝ සතුටු වේදනා ඇතිවන විට ඒවා අස්ථිර, දුක් සහිත, අනාත්ම බව අපි අමතක කරමු. අපේ චිත්ත වේග සමඟ කුලුපග වී ඇතිකර ගන්නා වූ වැරදි අවබෝධය නිසා පීඩාවට ලක්වෙමු.

මතකයන් හා සංඥාවන්
හඳුනා ගැනීමෙන් මතකයේ රඳවා ගනු ලබන දෙය සමඟ අපේ බැඳීම ලෝභය, ද්වේශය හා මෝහය පහළ වීමට හේතු වෙයි. වැරදි ලෙස වටහා ගැනීම, අපගේ යටි සිත් තුළ තැන්පත් වී එය නිරතුරු පවතින පුරුද්දක් බවට පත් වෙයි.

සංස්කාර ධර්මයන් හා මනස
මානසික ගති වල ස්වභාවය තේරුම් නොගන්නා නිසා අප ඒවාට ප්‍රතික්‍රියා දක්වමු. සිතිවිලි හා හැඟීම්, මනාපයන් හා අමනාපයන්, සතුට හා දුක එයින් පහළ වී ගනී. ඒවා අනිත්‍ය, දුක්ඛ, අනාත්ම බව අමතක කර දමා අපි ඒවා කෙරෙහි ඇලෙන්නෙමු.

විඥානය
අනිකුත් ස්කන්ධ විසින් දැනගනු ලබන දෙය අපි තදින් ග්‍රහණය කර ගනිමු. "මම වෙමි, මම දනිමි, මට දැනෙයි" යනාදී වශයෙන් කල්පනා කරමින් පුද්ගලයකු හැටියට වෙන්කර ගන්නා වූ මේ මුලාව සමග අපි වෙළෙන්නෙමු.



තායිලන්ත ජාතික අචාන් චා හිමියන්ගේ විදර්ශනා

පුදුම සහගත ලෙස
පිපාසාවක් දැනෙයි
සිතෙහි කිමිදෙමින්
යමක් සොයයි
මේ සිතෙහි
ප්‍රභාෂ්වර බව
මොනවට පසක් වෙයි
සිත සමාධිමත් කරන
භාවනාව..
නිවන් මග සොයයි
අනේ..
මේ විසල් ලොව තුළ
බුදුන් දුටුවා නම්...

"මෙත් සවිය සාමාජිකා 12-2228
චන්ද්‍රිකා කළුආරච්චි"

# පුදබිමක් හඳුනා ගනිමු.

## තන්තිරිමලේ

තන්තිරිමලේ යනු ශ්‍රී ලංකාවේ පැරණිතම ජනාවාස වලින් එකකි. මහින්දගමනයට පෙර සිටම මෙම ප්‍රදේශයෙහි ජනාවාස පැවති බවට සාදක තිබේ. එම මුල් අවදියේ සිට අනුරාධපුර යුගයේ අග භාගය දක්වා විහිදෙන කාල පරිච්ඡේදයකට අයත්වන ආගමික නිර්මාණ, වාරිකර්මාන්තය, කැටයම් හා වාස්තු විද්‍යාත්මක නිර්මාණ, ශිලා ලේඛන, සිතුවම් හා මිනිසුන් පරිහරණය කළ වෙනත් භාණ්ඩ ආදියේ පුරා විද්‍යාත්මක සාධක රාශියක් මෙහි දක්නට ලැබේ.

### පිහිටීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 366 තන්තිරිමලේ යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ මුල් කරගත් දෙමටමල්ගම, නෙළුම්විල, සඳමල්එළිය, තුප්පිටියාව, නවෝදගම, මහ ඇහැටුවැව, ඔය මඩුව යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල ව්‍යාප්තව පවතී. රිටිගල කන්දේ සිට ආරම්භ වන මල්වතුඔය කනදරාඔය හමුවන තෙක් උතුරු දිසා ගතව පැමිණ එහි සිට ක්‍රමයෙන් වයඹ දෙසට හැරීම නිසා නිර්මාණය වී ඇති වංගුව සහිත තැනිතලා නිම්නයේ පිහිටි මෙම ඓතිහාසික බිම්කඩ උතුරින් සහ නැගෙනහිරින් මල්වතු ඔයත්, බටහිරින් විල්පත්තු ජාතික වනෝද්‍යානය හා දකුණින් මහවිලච්චිය ප්‍රධාන මාර්ගයත් සීමා කොට ඇත.

### ළඟාවිය හැකි මාර්ග

අනුරාධපුර මහවිලච්චිය මාර්ගයේ කි.මී. 18 ක් ගියතැන දකුනු පසින් පිහිටි ශ්‍රී විමලඥාණ මාවත ඔස්සේ කි.මී. 18 ක් ඉදිරියට යනවිට තන්තිරිමලේ රජමහා විහාරය හමුවේ.

### නමෙහි විකාශන

මෙම ප්‍රදේශය දේවානම් පියතිස්ස රාජ්‍ය සමයේ තිවක්බ බමුණුගම යනුවෙන් හඳුන්වා තිබේ. විජය කුමරු ලක්දිවට පැමිණ මල්වතු ඔය දිගේ ගමන් කොට අනුරාධපුරය රාජධානිය කරගත් අතර ඔහු සමග පැමිණි අමාත්‍යවරුන්ටද එක්එක් දිසාවල ජනාවාසගොඩනැගීමට උපදෙස් දුන්හ. ඒ අනුව උපතිස්ස නම් අමාත්‍යවරයා මල්වතු ඔයට කනදරා ඔය හමුවන ස්ථානය මුල්කරගෙන ඇතිකල උපතිස්සගම යනු අද තන්තිරිමලය නම් මෙම ප්‍රදේශයයි. සාලිය කුමරු හා අශෝක මාලාවන්ගේ අසම්මත විවාහය නිසා පිටුවහල් කරනු ලදුව එම දෙදෙනා මෙම ප්‍රදේශයේ කලක් ජීවත් වී ඇත. පසුව දුටුගැමුණු රජතුමා ඔවුන්ට සමාව දී ඇත. එහිදී පරිත්‍යාග කළ තන්තිරි යන සමනල විශේෂයේ හැඩය සහිත රන්මාලය මෙහි නිදන් කොට ඇති නිසා තන්තිරිමාලය යන්න සෑදුනු බව ජනවහරේ එයි.

අනුබුදු මිහිදු මහ රහතන් වහන්සේ විසින් ශ්‍රී ලංකාවෙහි බුදු සසුන පිහිටුවීමත් සමඟම මෙහෙණි සසුන පිහිටුවීමේ අරමුණින් සඟමිත් මහ රහත් මෙහෙණින් වහන්සේ මෙහි වැඩම වන අවස්ථාවේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ද වැඩම වනලදී. එවිට යාපනය හා මන්නාරම යන නගර දෙක මැදිව පිහිටි දඹකොළ පටුන නම් වූ තොටුපලට ගොඩබට මොහොතේ දේවානම්පියතිස්ස මහරජතුමා කරවටක් පමණ ජලයේ ගමන් කොට රංමුවා පාත්‍රයකට බෝධීන් වහන්සේ පිළිගන්නා ලදහ. එහි සිට පෙරහරින් අනුරපුර දක්වා යන ගමන් මගෙහි එවකට තිවක්බ බමුණුගම නම් වූ මෙහි සිටි ප්‍රධානියා මල්වතු ඔය දක්වා තම පිරිසත් සමග පෙර ගමන් කොට හරසරින් පිළිගෙන තම ගම්මානයෙහි පිහිටි අලංකාරම සහ උසම ස්ථානය වන මෙම ගල් තලාවෙහි බෝධීන් වහන්සේ ඇතුළු පූජනීය හා රාජකීය පිරිසට නවාතැන් සපයා පුදපූජා සහ ආගන්තුක සත්කාරදක්වා ඇත. එම පූජනීය පිරිසට මිහිඳු මහරහතන් වහන්සේ, සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේ, ඇතුළු රහත් මෙහෙනින් වහන්සේලා 11 නමක්, දේවානම් පියතිස්ස රජතුමා අතුළු රාජකීය පිරිසද වූහ. එදින රාත්‍රියේ බෝධීන් වහන්සෙ අහසට පැන නැගී බුදු රැස් විහිදුවමින් පෙළහර පෑ බවද සඳහන් වේ.

පසු දින අනුරාධපුරයට වැඩමවන ලදුව මහත් හරසරින් මහමෙව්නා උයනෙහි රෝපණය කරන ලදි. මෙහිදී තවත් බෝ අංකුර 08 ක් පැන නැගී ඇත. මෙමෙ බෝධි රෝපණ උත්සවයට ලක්දිව සෑම ප්‍රදේශයක්ම නියෝජනය කරමින් ප්‍රභූන් ඇතුලු පිරිස් පැමිණ සිටියහ. මේ අතර තිවක්බ බමුණු තෙමේද ප්‍රධාන ස්ථානයක් ගනී.

බුදුරජාණන් වහන්සේගේ අධිෂ්ඨානයක් සහ මිහිදු මහරහතන් වහන්සේගේ තීරණයක් අනුව එම අංකුර 8 න් එක් අංකුරයක් තිවක්බ බමුණුතුමාටද ලැබී ඇත. ඔහු එය මහත් හරසරින් පිළිගෙන නැවත විශාල පෙරහරකින් මෙහි වඩමවා පලමු දින ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩසිටි ගල්තලාව මතුයෙහිම කවාකාර පවුරක් තනවා එහි රෝපණය කරන ලදි.

වසර දහස් ගණනාවක් අව්වැසි සුළං හා වන සතුන්ගෙන්ද පීඩා විඳි නමුත් බුදුන් වහන්සේගේ අධිෂ්ඨානයක් නිසාම මෙම අෂ්ඨඵල බෝදින් වහන්සේ මේ දක්වාම ජීවමානව වැඩසිටීම මහත් ආශ්චර්ය ජනකය. දෙස් විදෙස් බෞද්ධ ජනයා මෙම බෝධීන් වහන්සේ සමීපයේදී ලබන මානසික සුවය අපමණය. ඇතමෙක් මෙහි ඇති ශාන්ත භාවයට ඇලී ගැලී දින ගණන් බෝ සෙවනෙහි බවුන් වඩති. මේ මා හැගි බෝධීන් වහන්සේ වැද පුද ගැනීමෙන් ඔබටද සිසිලස හා බුද්ධාලම්මන ප්‍රීතිය සමග නොකිව හැකි තරමේ චිත්ත ඒකාග්‍රතාවයක් සමග විශාල සතුටක් ලබාගත හැකිවේ.




**මෙත් සවිය වෙබ් අඩවියට ඔබත් පිවිසෙන්න**

**www.methsaviya.org**

2007 වෙසක් පුන් පොහෝ දින දියත් කරනු ලැබූ මෙත් සවිය මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදයේ වෙබ් අඩවිය වර්ථමානය වනවිට විශාල පිරිසක් භාවිතා කරමින් පවතී.
මෙම වෙබ් අඩවිය හරහා පහත සඳහන් සේවා ලබා ගැනීමට අප සංසදය විසින් අවස්ථාව සලසා ඇත.

❖ මෙත් සවිය පිළිබඳ තොරතුරු
❖ **News**
❖ **Download**
❖ **Photo gallery**

ඉදිරියේදී මෙම වෙබ් අඩවිය මගින් සංසදයේ අළුත්ම තොරතුරු නිරන්තරයේන් ලබාගැනීමට ඔබට හැකිවනු ඇත.

# ත්‍රිපිටක ධර්ම ග්‍රන්ථ හැඳින්වීමක්...

බුදුරජාණන් වහන්සේ විසින් දේශිත සියලුම දේශනා ''ධම්ම විනය'' නමින් හැඳින්වූ බව මහා පරිනිබ්බාණ සූත්‍රයේ සඳහන් වේ. (දී.නි.ම.පරි.සූත්‍රය) මෙහි ධම්ම වශයෙන් සැලකෙන්නේ විවිධ අවස්ථාවල දී විවිධ මාතෘකා යටතේ විවිධ පුද්ගලයන්ට, ලෝකය හා සත්වයා පිළිබඳ කරුණු විග්‍රහ කරමින් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්ම කරුණුය.''විනය''වශයෙන් හැඳින්වෙන්නේ ඒ ධර්ම කරුණු ප්‍රත්‍යක්ෂ කිරීමේදී අනුගමනය කළයුතු ප්‍රතිපත්තිමාලාවයි.මෙම ධම්ම විනය යන බෙදීමට වෙනස් "නවඞගසත්ථු ශාසනය" යනුවෙන් කොටස් නවයකට බෙදා දැක්වීමක්, මජ්ඣිම නිකායේ අලගද්දූපම සූත්‍රයේ (මනි.අල.සූත්‍රය) සඳහන් වේ. ඒවා නම් "සුතතං, ගෙය්‍යං, වෙය්‍යාකරණං, ගාථා, උදානං, ඉති උත්තකං, අද්භූත ධම්මං,වෙදල්ලං " යනුවෙනි.

1. සුත්තං = විනය පිටකය, නිද්දෙස, සුත්ත නිපාතයේ සඳහන් මංගල, රතන ආදී සූත්‍ර මෙයට ඇතුළත් වේ.

2.ගෙය්‍යං = ගාථා සහිත සියලුම දේශනාය.

3.වෙය්‍යාකරණං = ගාථා රහිත දේශනාය.අභිධර්මය මෙයට ඇතුළත් වේ.

4.ගාථා = ධම්මපද, ථේරගාථා,ථේරීගාථා.

5.උදාන = බුදුරජාණන් වහන්සේත් රහතන් වහන්සේලාත් විසින් ප්‍රීතිය ප්‍රකාශ කෙරෙනෙ දේශනා, මෙයට ඇතුළත් වේ.

6.ඉති උත්තක = "ඉති වුත්තං" යැයි පටන්ගෙන කරන සූත්‍ර දේශනායි.

7."ජාතක" = බෝසත් චරිත කතා ඇතුලත් දේශනයි.

8.අදභූත ධම්ම = විවිධ අද්භූත සිදුවීම් මුල්කරගෙන බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය.

9.වෙදල්ල = චුල්ල, වෙදල්ල, මහා වෙදලල, සම්මා දිට්ඨි, සකකපඤහ ආදී සූත්‍ර දේශනායි.

මෙසේ නවංග සත්ථු ශාසනය වශයෙන් දක්වා ඇති ධම්ම විනය වඩාත් ක්‍රමවත්ව සංග්‍රහ කළේ ප්‍රථම ධර්ම සංගායනාවේදීය.බුද්ධ පරිණිර්වාණයෙන් පසුව මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රජගහ නුවර වේභාර පර්වතයේ සත්තපණ්ණි ගල් ගුහාවට රැස්වූ පන්සියයක් මහ රහතන් වහන්සේලා විසින් සියලු බුද්ධ දේශනා "ධර්ම විනය" වශයෙන් සංගායනා කරන ලදී. පසුව එම ධර්ම විනය ආරක්ෂා කරගෙන ඒම සඳහා එහිදී එක් එක් මහතෙර නමකට පවරන ලදී.ඒ අනුව උපාලි මහරහතන් වහන්සේට විනය පිටකයත්, ආනන්ද මහරහතන් වහන්සේට දීඝ නිකායත්, සැරියුත් මහරහතන් වහන්සෙගේ ශිෂ්‍යයන්ට මජ්ඣිම නිකායත්, අනුරුද්ධ මහරහතන් වහන්සේට අංගුත්තර නිකායත් පැවරිණි."ආවුසෝ ඉදං තුයහං නිස්සිතකේ වාචෙහිති" (දී.නි,10 පිටුව) ඇවැත්නි ඔබගේ ශිෂ්‍යයන් විසින් කටපාඩමින් ඒ ඒ කොටස් ආරක්ෂා කළ යුතු යැයි නියම කරන ලදී. මෙසේ ඒ ඒ පරම්පරා වලට නියම වූ කොටස් ඒ ඒ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරා විසින් වන පොත් කෙරෙමින් ආරක්ෂා කරන ලදී

මෙසේ කට පාඩමින් ආරක්ෂා කරන ලද පෙළ දහම "පිටක" (භාජනය) වශයෙන් කොටස් තුනකි. එනම් සූත්‍ර පිටකය, විනය පිටකය හා අභිධම්ම පිටකය යනුවෙනි.


## සූත්‍ර පිටකය

සූත්‍ර පිටකයේ ඇතුළත් වන්නේ විවිධ ස්ථාන වලදී විවිධ පුද්ගලයන්ට බුදුරජාණන් වහන්සේ විසින් කරන ලද ධර්ම දේශනාය.එම ධර්මදේශනා වලින් බොහෝ දෙනාට ලෞකික ලෝකෝත්තර අර්ථ ප්‍රකාශ කෙරෙන නිසාත් හොඳින් ධර්මය ආරක්ෂා කෙරෙන නිසාත් හොඳින් දේශනා කරන ලද නිසාත් "සූත්‍රයක්" හෙවත් නූලක් මෙන් එකට සම්බන්ධ වී ඇති නිසාත් ඒවා "සූත්‍ර" නමින් හැඳින්වෙන බව

"අත්ථානං සුචනතෝ සුවුතො සවනතොච සුදනතො සුත්තාණ සුත්තසභගතො ච සුත්තං සුත්තන්ති අක්ඛාතං"

යනුවෙන් සමන්ත පාසාදිකාවේ දැක්වේ.මේ සූත්‍ර දේශනා වලින් ඉදිරිපත් කෙරෙන ලෝක ව්‍යවහාර සම්මුතු ඇසුරු කරමින් ලෝකය හා සත්වයා පිළිබඳ යථාර්ථය පැහැදිලි කිරීමයි. රජ, සිටු, ඇමති, වෙලඳ, බ්‍රාහ්මණ, ශුද්‍ර ගොවි,කම්කරු ආදී විවිධ ක්ෂේත්‍රවල මිනිසුන්ගේ ජීවිතය හා සම්බන්ධ සිදුවීම් හා ගැටලු ඇසුරු අරගන, කරන ලද දේශනා සූත්‍ර පිටකයේ ඇත.ජන ජීවිත හා සම්බන්ධ, මේ සූත්‍ර දේශනා බොහෝ දෙනාට තේරුම් ගැනීමට පහසුය. කසීභාරද්වාජ සූත්‍රය, දේශනා කර ඇත්තේ ගොවිතැන් කර ජීවත්වෙන බ්‍රාහ්මණයකු හා ගොවිතැන සම්බන්ධ කර ගෙනය.මංගල සූත්‍රය දේශනා කර ඇත්තේ, මිනිසුන් හා දෙවියන් අතර ඇතිවූ මංගල කරුණු පිළිබඳ සැක දුරු කිරීම සඳහාය. සාමඤ්ඤඵල සූත්‍රය දේශනා කරන ලද්දේ, අජාසත් රජතුමා විසින් "ශ්‍රමණයකු වීමේ ප්‍රයෝජන කුමක් දැ "යි අසන ලද ප්‍රශ්නයට පිළිතුරු වශයෙනි. මේ සියලු දේශනා අන්තර්ගත සූත්‍ර පිටකයට "නිකාය" නමින් හැඳින්වෙන ග්‍රන්ථ පහක් ඇත.

1. දීඝ නිකාය
2. මජ්ඣිම නිකාය
3. සංයුක්ත නිකාය
4. අංගුත්තර නිකාය
5. ඛුද්දක නිකාය



සීලඛන්ධ
- බ්‍රහ්මජාල සූත්ත
- සාමඤ්ඤඵල සූත්ත
- අම්බට්ඨ සූත්ත
- සොණ දණ්ඩ සූත්ත
- කූට දන්තසූත්ත
- මහාලි සූත්ත
- මහා සීහනාද සූත්ත
- ජාලිය සූත්ත
- පොට්ඨපාද සූත්ත
- සුභ සූත්ත
- කෙවට්ඨ සූත්ත
- තේවිජ්ජ සූත්ත

මහාවග්ග
- මහාපදන සූත්ත
- මහානිදන සූත්ත
- මහ පරිනිබ්බාන සූත්ත
- මහා සුදස්සන සූත්ත
- ජනවසභ සූත්ත
- මහා ගෝවින්ද සූත්ත
- මහාසමය සූත්ත
- සක්කපඤ්හ සූත්ත
- මහාසතිපට්ඨා සූත්ත
- පයාසිරාජඤ්ඤ සූත්ත


පාථික වග්ගය
- පාටික සූත්ත
- උදුම්බරික සූත්ත
- චක්කවත්ති සීහනාද
- අග්ගඤ්ඤ සූත්ත
- සම්පසාදනීය සූත්ත
- පාසාදික සූත්ත
- ලක්ඛණ සූත්ත
- සිගාල සූත්ත
- ආටානාටිය සූත්ත
- සංගීති සූත්ත
- දසුත්තර සූත්ත

මේ සූත්‍ර දේශනා දීර්ඝය. ඒවායේ ධර්ම කරුණු මෙන්ම සාමාජික, ආගමික, දේශපාලනික ආදී විවිධ තොරතුරු විස්තර සහිතව අන්තර්ගත වේ. උදහරණ වශයෙන් සාමඤ්ඤඵල සූත්‍රය දැක්විය හැකිය.එය දේශනා කළේ අජාසත් රජතුමාටය. එම දේශනාව අසා රජතුමාට නිවන් දැකීමට තරම් අවස්ථාවක් තිබුණත් පිතෘඝාතක අකුසල කර්මය නිසා ඒ සඳහා සිත් එකඟකර ගත නොහැකි විය.එහෙත් ධර්ම දේශනාව අවසානයේදී අජාසත් රජතුමා ඉමහත් සතුටින් යුතුව තෙරුවන් කෙරේ පැහැදී බුදුරජාණන් වහන්සේට ගෞරව දක්වා ආපසු ගියේය.මේ දීර්ඝ ධර්ම දේශනාව ඇතුළත් වන්නේ දීඝ නිකායේ දෙවෙනිව ඇති "සාමඤ්ඤඵල" සූත්‍රයේය. එහි ඇති අම්බට්ඨ, සොණදණ්ඩ, කූට දන්ත, මහාලි, මහාසීහනාද, ආදී සූත්‍ර 34 ත් එසේම දීර්ඝ විස්තර ඇති ධර්ම දේශනාය.

මජ්ඣිම නිකායේ ඇතුළත් වන්නේ සූත්‍ර දේශනා 152 කි. දීඝනිකායේ සූත්‍ර මෙන් දීර්ඝ නැත. එහෙත් අනෙකුත් නිකාය වල සූත්‍ර වලට වඩා දීර්ඝය. ඒ නිසා දීඝ නිකායේ සූත්‍ර වලට වඩා කෙටි වූත්,සංයුක්ත නිකාය, අංගුත්තර නිකාය, ඛුද්දක නිකාය යන නිකාය වල ඇතුළත් සූත්‍ර වලට වඩා දීර්ඝ වූත් නිසා මධ්‍යම ප්‍රමානයෙන් යුක්තය. ඒ නිසා මධ්‍යම ප්‍රමාණයේ සූත්‍ර ඇතුලත් කොටස "මජ්ඣිම නිකාය" සේ හැඳින්වේ.
මජ්ඣිම නිකායේ සූත්‍ර වෙන්කර ඇත්තේ පණ්ණාසක හෙවත් 50 වශයෙන් කොටස් තුනකටය. එනම්,

1. මූල පණ්ණාසකය (මුල් සූත්‍ර 50)
2. මජ්ඣිම පණ්ණාසකය (මැද සූත්‍ර 50)
3. උපරි පණ්ණාසකය (අවසාන සූත්‍ර 50)

එහෙත් උපරිම් පණ්ණාසකයේ සූත්‍ර 52 ක් ඇත.එනිසා මජ්ඣිම නිකායේ සියලු සූත්‍ර වල එකතුව 152 කි.මේ එක් පණ්ණාසකයක් නැවත සූත්‍ර 10 බැගින් වග්ග වලට බෙදා ඇත. එය මෙසේය.(55 වැනි පිටුව බලන්න)
මජ්ඣිම නිකායේ මුල් කොටස වූ මූල පණ්ණාසකයේ ඇති මූපරියායවග්ග යේ පළමු වැන්න මූලපරියාය සූත්‍රයයි.එය බුදුරජාණන් වහන්සේ විසින් උක්කට්ඨා නුවර සුභග වනයේ සාල රාජ මූලයේදී භික්ෂූණ් වහන්සේලාට දේශනා කරන ලදී.එහි විස්තර වන්නේ "සබ්බ ධම්ම මූල පරියාය" යි. එනම් ආර්ය ධර්මයෙහි දක්ෂකමක් නැති පෘථග්ජන පුද්ගලයා පඨවි, ආපෝ, තේජෝ, වායෝ ආදිය පිළිබඳව වැරදි ලෙසින් අවබෝධ කර ගනී.නමුත් ආර්ය ශ්‍රාවක වූ සේඛ පුද්ගලයා පඨවි, ආපෝ, තේජෝ, වායෝ ආදිය "සතර මහා භූතාදිය" සේ දැන ගත්තත් ඒවා පිළිබඳව මඤ්ඤනා ඇති කර නොගනී. ඒ නිසා ඒවාට නො ඇලේ.ඇලීම දුකට මුල බව දැන විරාගී වූ නිර්වානාවබෝධය කරයි. එම දේශනාවෙන් භික්ෂූන් වහන්සේලා සතුටට පත් වූහ.මෙසේ සූත්‍ර දේශනා එකසිය පනස් දෙකක් මජ්ඣිම නිකායේ ඇතුළත් වේ.




## සංයුක්ත නිකාය

සංයුක්ත නිකායේ ඇතුළත් වන්නේ විවිධ පුද්ගලයන් දෙවිවරුන් යක්ෂයන් හා විවිධ කරුණු මුල් කර ගෙන බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද සූත්‍ර 7762 කි.ඒවා සගාථ වග්ග, නිදාන වග්ග, ඛන්ධ වග්ග, සළායතන වග්ග, මහා වග්ග වශයෙන් කොටස් පහකට බෙද නැවත එක් එක් වග්ග, සංයුක්ත 54 කට බෙදේ. ඒ ඒ සංයුක්තයක් නැවතත් සූත්‍ර 10-15 ආදී වශයෙන් වග්ග වලට බෙදේ.
පළමු වන සගාථ වග්ගයේ සංයුක්ත 11 ක් ඇත.ඒවා නම් දේවතා සංයුක්තය, දේවපුත්ත සංයුක්තය, කෝසල සංයුක්තය, මාර සංයුක්තය, භික්ෂුණී සංයුක්තය, බ්‍රහ්ම සංයුක්තය, බ්‍රාහ්මණ සංයුක්තය, වංගීස සංයුක්තය, වන සංයුක්තය, යක්ඛ සංයුක්තය, සක්ක සංයුක්තය, වශයෙනි. මේ සංයුක්ත 11 හි සූත්‍ර 271 ක් ඇත. එයින් දේවතා සංයුක්තයේ නළ, නන්දන, සත්ති,සතුල්ලපකායික, ආදිත්ත ජාරා, අන්ව, ඣත්වා යැයි වග්ග අටකි.එහි සූත්‍ර 81 කි.එයින් නල වග්ගයේ පළමු වැන්න, ඔඝතරණ සූත්‍රයයි. එය දේශනා කර ඇත්තේ දේවතාවකුගේ ප්‍රශ්නයකට පිලිතුරු වශයෙනි.
මෙසේ දේවතාවන් විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් කරන ලද දේශනා දේවතා සංයුක්තයේ අන්තර්ගත වේ.අනෙක් සංයුක්තවලත් එසේම එක් එක් වර්ග වලට අයත් සූත්‍ර එක් රැස් කර ඇත.එනිසා සංයුක්ත නිකායේ ඇතුලත් වන්නේ විවිධ පුද්ගලයන් මුල්කර ගෙන කරන ලද කෙටි සූත්‍ර දේශනාය.

## අංගුත්තර නිකාය

අංගුත්තර නිකායේ සූත්‍ර 9557 ක් ඇත.මේ වර්ග කර ඇත්තේ ඒකක නිපාත, දුක නිපාත, චතුක්ක නිපාත, ආදී වශයෙන් ඒකාදසම නිපාතය දක්වා නිපාත එකොළහකට ය. ඒකක නිපාතයේ ඇතුලත් වන්නේ එක් කාරණයක් ගැන පමණක් කියැවෙන සූත්‍ර 632 කි.එම සූත්‍ර 632 ත් වර්ග වශයෙන් 16 කට බෙදේ.
එහි ප්‍රථම සූත්‍රයෙන් ප්‍රකාශ වන්නේ "මහණෙනි, මිනිසාගේ සිත් ඇද ගන්නා රූප අතර කාන්තාවන්ගේ රූපය තරම් ප්‍රබල වෙනත් රූපයක් නැත." යන කාරණයයි.මෙසේ දෙවනි තුන්වෙනි සූත්‍ර වලත් මිනිස් සිත ඇද ගන්නා ශබ්ද,ගන්ධ,රස,ස්පර්ශ යන කරුණු ඉතාම ප්‍රබල බව ප්‍රකාශ වේ.මෙසේ එකක නිපාතයේ ඇති නීවරණප්පහාන වග්ග 16 න් ම ඉදිරිපත් කෙරෙන සියලුම සූත්‍ර වලින් ප්‍රකාශ වන්නේ එක් කරුණක් පමණි. ඒ නිසා ඒකක නිපාතයේ වග්ග 16 හි ඇති සූත්‍ර 632 න් ම ඉදිරිපත් කෙරෙන්නේ එක් කරුණක් අන්තර්ගත දේශනා පමණි.දුක නිපාතයේ කරුණු දෙකක් සම්බන්ධ දේශනාත් තික නිපාතයේ කරුණු තුනක් සම්බන්ධ දේශනාත් ඇත. මෙසේ අංක පිළිවෙළින් වැඩි වී කරුණු 11 ක් අන්තර්ගත දේශනා ඒකාදශම නිපාතයේ ඇතුලත් වේ.ඒ නිසා අංගුත්තර නිකායේ සූත්‍ර බෙද දැක්වෙන්නේ සංඛ්‍යාත්මක පදනමකටයි.

## ඛුද්දක නිකාය

ඛුද්දක නිකායට අයත් පොත් 15 ක් ඇතුළත් වේ.ඒවා ඛුද්දක පාඨ, ධම්මපද, උදාන, ඉති උත්තක, සුතත නිපාත, විමානවත්ථු, පේතවත්ථු, ථේර ගාථා, ජාතක, නිද්දෙස, පටිසම්භිදාමග්ග, අපදාන, බුද්ධවංශ, චරියා පිටක වශයෙනි.මෙයින් පලවෙනි උද්දක පාඨ නම් ග්‍රන්ථය ඉතා කුඩා සංග්‍රහයකි.එහි මුලින්ම අන්තර්ගත වන්නේ සරණ ගමනයයි. දස සික්ඛා පද, ද්වත්තිංසාකාර, කුමාර පඤ්හ, මංගල සූත්ත,රතන සූත්ත,තිරොකුඩ්ඩ සූත්ත, නිධිකණ්ඩ සූත්ත, මෙත්ත සූත්ත, යන දේශනා ඇත.තෙරුවන් සරණ ගිය බෞද්ධයකුගේ සාමාන්‍ය ජීවිතයකට අවශ්‍ය ධර්ම කරුණු, මේ සූත්‍ර වලින් විස්තර කෙරේ.
ධම්ම පදයේ ඇතුළත් වන්නේ ගාථා 423 කි. එම ගාථා දේශනා කිරීමට හේතු විස්තර කරමින් නිධාන කථා 299 ක් ධම්ම පදට්ඨ කථාවෙහි විස්තර කෙරේ.
"උදාන" නම් ග්‍රන්ථයේ ඇතුළත් වන්නේ බුදුරජාණන්වහන්සේ විවිධ අවස්ථා වලදී දේශනා කරන ලද ප්‍රීති සහගත ප්‍රකාශනයි.එහි වගග 8 ක සූත්‍ර 80 ක් ඇත.

ඉතිවුත්තක නම් ග්‍රන්තයේ සෑම සූත්‍රයක්ම ආරම්භ වන්නේ "ඉතිවුත්තං", මෙසේ දේශනා කරන ලදී.යන වාක්‍යයෙනි.ඒ නිසා ඉති වුතක නම් විය. එහි වර්ග 11 ක සූත්‍ර 111 ක් ඇත.
විමානවත්තු නම් පොතේ විස්තර වන්නේ විවිධ දෙවිවරුන් පිළිබඳ කථා පුවත්ය.එහි ගාථා 979 කින් ගාථා 85 ක් කියැවේ. එම කථා වලින් ඒ ඒ දෙවිවරුන් විවිධ කුසල කර්ම කර දේවත්වයට පත්වූ බව ප්‍රකාශ කෙරේ.
ප්‍රෙතවත්ථු නම් පොතේ ඇතුළත් කථා 51 න් විස්තර වන්නේ මිනිස් ලොවේ දී විවිධ අකුසල කර්ම කර ප්‍රේතයන වී දුක් විඳින ආකාරයයි.

ථෙර ගාථා පොතේ 1291 ක් ඇත.එහි රහතන් වහන්සේලාගේ අත්දැකීම් ඇතුළත් කථා 264 ක් අන්තර්ගත වේ.මෙයට සමාන කථා ඇති ථෙරීගාථාවෙන් විස්තර වන්නේ, රහත් වූ භික්ෂුණීන් වහන්සේලාගේ ජීවිත පිළිබඳ විස්තරයයි.එහි ගාථා 521 කි.කථා 74 කි.
ජාතක වලින් විස්තර වන්නේ බුදුරජාණන් වහන්සේගේ අතීත ජීවිත කථා හෙවත් බෝධිසත්ව චරිත කථායි.ඒ කථා කෙටියෙන් ප්‍රකාශ වන ගාථා 6741 ක් ඇත. ඒ ගාථා වලට විස්තර කථා 547 ක්, ජාතකට්ඨකථාවෙහි ඇත.
පටිසම්භිදමග්ග නම් පොතේ විස්තර වන්නේ, ඤාණකථා, දිට්ඨි කථා, ආනාපාන සති කථා, ඉන්ද්‍රිය කථා යන ආදී කථා 12 කි. එයින් ඒ ඒ ධර්ම කරුණු පිළිබඳව විස්තර ඉදිරිපත් කෙරේ.
අපදන වලිඳ විස්ත්‍ර වන්නේ චරිත කථාය. එහි බුදු, පසේ බුදු, යන චරිත දෙකක්ද ථෙර කථා 550 ක් හා ථෙරි කථා 40 ක් ද ඇත.බුද්ධ වංශයෙන් ඉදිරිපත් වන්නේ බුද්ධ චරිතයයි. චරියා පිටකයීන් පැහැදිලි කෙරෙන්නේ දාන, සීල, නෙක්ඛම්ම, අට්ඨාන, සච්ච, මෙත්තා, උපෙක්ඛා, යන පාරමිතා හත පිළිබඳවයි.

## විනය පිටකය

බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂූන් හා භික්ෂුණීන්ගේ චාරිත්‍ර සීල ආදී වශයෙන් කාය වාග් සංවරය සම්බන්ධයෙන් පනවා ඇති ශික්ෂා පද සමූහයක් විනය පිටකයේ ඇතුලත් වේ.එහි ආණා දේශනා හෙවත් ආඥාදේශනාවක් වශයෙන්ද හැඳින්වේ.එනිසා විවිධ වූ විශේෂ න්‍යාය ක්‍රම ඇති නිසාත් කය වචනය දෙක සංවර කර ගැනීමට හේතු වන නිසාත් විනයාර්ථ දන්නවුන් විසින් "විනය" යැයි හඳුන්වන බව සමන්ත පාසාදිකාවේ, "විවිධ විසෙසනයතතා විනයනතො චෙව කාය වාචානං විනයත්ථ විදූහි අයං විනයො, වොනයොති අකඛාතං" (සම.පා.8 පිටුව) යැයි පැවසේ.
විනය පිටකයට අයත් "පාලි" යන නමින් හැඳින්වෙන ග්‍රන්ථ 5 ක් ඇත. ඒවා පරාජිකා පාලි, පරිවාර පාලි, මහාවගග පාලි, චුල්ල වගග පාලි, යනුවෙනි.එහි භික්ෂූන් වහන්සේලා සඳහා පණවන ලද ශික්ෂා පද 304 ක් ද ඇතුළත් වේ. මෙසේ භික්ෂු භික්ෂුණී වශයෙන් දෙපිරිසට වෙන් වෙන් වශයෙන් ශික්ෂා පද දේශනා කර ඇති නිසාද ඒ ශික්ෂා පද දේශනා කිරීමට හේතු පුද්ගලයා, වත්ථු, පඤ්ඤත්ති, අනුපඤ්ඤත්ති, ආපත්ති, ආනාපත්ති, වශයෙන් විභාග කෙරෙන නිසා "උභතොවිභඩග" වශයෙද සූත්‍ර මෙන් දේසනා කර ඇති නිසා "සූත්ත විභඩ්ග" වශයෙන්ද හැඳින්වේ.

## පරාජිකා පාලි

"පරාජිකා පාලි" නම් ප්‍රථම විනය ග්‍රන්ථයයි. එහි මුලින්ම විස්තර වන්නේ බුදුරජාණන් වහන්සේගේ ධර්මය ඇසූ වේරඤජා බ්‍රාහ්මනයා පැහැදී ඉදිරි වස් කාලය වේරඤජාවේ ම වාසය කරන ලෙස ආරාධනා කිරීම හා දුර්භික්ෂයක් නිසා බුදුරජාණන් වහන්සේ ඇතුලු භික්ෂූන්ට දානය නොලැබීම, අස් වෙළඳුන්ගෙන් ලැබුණු ධාන්‍ය වලද වස් කාලය ගෙවීම, බුද්ධ ශාසනයේ ආරක්ෂාව සඳහා ශික්ෂා පද පනවන ලෙස සැරියුත් මහරහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටීම හා සුදුසු අවස්ථාව එළඹෙන තුරු ශික්ෂා පද පැනවීම බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කිරීම, වස් අවසානයේ බුදුරජාණන් වහන්සේ ප්‍රධාන භික්ෂු පිරිස වේසාලියට වැඩමවීම ආදී විස්තරය.අනතුරුව විස්තර වන්නේ ප්‍රථම පාරාජිකාවය. එය පණවා ඇත්තේ විසාලා මහනුවර සිටි සුදින්න නම් සිටු පුත්‍රයෙක් බණ අසා පැහැදී මහණ වී පසුව පුරාණ දුතිකාවක් සමඟ මෛථුන ධර්මයෙහි හැසිරීම හේතු කොටගෙනයි.මේ මෛථුනධමම පාරාජිකාව බුදුරජාණන් වහන්සේ විසින් පැනවූ ප්‍රථම ශික්ෂාවයි. පසුව අදින්නාදනා පාරාජිකාව,මනුසසවිගගහ, අනතුරුව සංඝාධිසේස 13, අනියත 2, නිසස ගගිය පාඩිත්‍යය 13 ඇතුළුව ශික්ෂා පද 49 ක් පාරාජිකා පාලියේවිස්තර කෙරේ.

## පරිවාර පාලිය

පරිවාර පාලියේ ඇතුළත් වන්නේ පාරාජිකා පාලි හා පාචිත්තිය පාලි යන ග්‍රන්ථ දෙකේ අන්තර්ගත ශික්ෂා පද පිළිබඳ විස්තරයි. එහිදී ශික්ෂා පද පැනවීමට හේතු වූ නිදන, පඤ්ඤත්ති, අනුපඤ්ඤත්ති, විපත්ති ආදිය විස්තර කෙරේ.

## මහාවගග පාලි

මහා වගග පාලියේ බන්ධක 10 ක් ඇත.මහා කඛනධක, උපොසථබන්ධක, වසසූපනායික කඛනධක, චමම, භෙසජ්ජ, කඨින,චීවර, චමෙපෙය්‍යය, කොසම්බි, යන බන්ධක වලින් භික්ෂු ජීවිතයට අදළ වූ ආචාර විධීන් විස්තර වේ. මෙහි මුලින් ඇති මහා බන්ධය ආරම්භ වන්නේ බුද්ධ චරිතයේ තොරතුරු හා භික්ෂු සමාජයේ සංවර්ධනය විස්තර කරමින්ය. එහිදී පැවදි කිරීම, උපසම්පදාව, ආචාර්යය, උපධ්‍යාය, සදධි විහාරික ආදී වත්පිළිවෙත් ගැන විස්තර කෙරේ.එහි පෝය කර්ම, වස්විසීම, කඨින චීවර, ආදී කරුණු පැහැදිලි කර ඇත.

## චුලල වගග පාලි

තජ්ජනීය කමම, නිසසය කමම, පටිසාරණීය කම, ආදී විනය කර්ම පිළිබඳව බුද්ධපරිනිර්වාණය, ප්‍රථම ධර්ම සංගායනා පිළිබඳවත් විස්තර, චුලල වග්ග පාලියේ ඇත.පළමු වන ධර්ම සංගායනාව ගැන විස්තර වන්නේ පඤ්ච සතිකඛනධකයේ ය. දෙවන ධර්ම සංගායනාව පිළිබඳ විස්තර වන්නේ සත්ත සතික්ඛනධකයේ ය.

## පාචිත්තිය පාලි

පාචිත්‍යපාලියෙහි කොටස් දෙකක් ඇත. එයින් මුල් කොටසේ ඇතුළත් වන්නේ භික්ෂු විනයට සම්බන්ධ පාචිත්තිය 92, පාටිදේසනීය 4, සේඛියා 75, සහ අධිකරණ 7 ය. දෙවන කොටසේ අන්තර්ගත වන්නේ භික්ෂුණීන් සඳහා පනවා ඇති පරාජිකා සංඝාධිසේස නිස්සග්ගිය, පාචිත්තිය, පටිදෙසනීය, සේඛියා අධිකරණසමථ යන ශික්ෂා පද පිළිබඳ විස්තරය.

මෙසේ භික්ෂු භික්ෂුණී විනය ශික්ෂා පද ඉදිරිපත් කෙරෙන පාරාජිකා පාලි හා පාචිත්තිය පාලි යන ග්‍රන්ථ දෙක උභතො විභංග නමින්ද හැඳින්වේ.

## අභිධමම පිටකය

අභිධර්මය පරමාර්ථ දේශනාවකි.එහි විග්‍රහ කෙරෙන්නේ ස්කන්ධ ධාතු, ආයතන, ඉන්ද්‍රිය, සත්‍ය, ප්‍රතීත්‍ය සමුත්පාදය, මාර්ග ඵල නිර්වාන ආදී වූ පරිච්ජින්න වූ උත්තාධික වූ ධර්මයයි. ඒ බව සමන්ත පාසාදිකාවේ,

"යං එත්ථ බුඞ්ඩිමන්තො සලක්ඛණා සුපූජිතා පරිච්ජිතා වුත්තාධිකාව ධම්මා අභිධම්මොතෙන අක්ඛාතො"

යැයි (ස.ප.9 පිටුව) ප්‍රකාශ වේ.මේ අභිධමයෙන් කෙරෙන්නේ ධර්මයෙහි අන්තර්ගත විශේෂ කරුණු වඩාත් ගැඹුරින් විග්‍රහ කිරීමයි. එනිසා "අභිධර්මය" නම් ධර්මය පිළිබඳව අතිරේක, විස්තර කිරීමක් සේ ධම්මසඞ්ගණිප්පකරණට්ඨ කථාවේ ධම්මවිතිරෙකධම්මවිසෙසටෙඨන අතිරේක විසෙත්ථදීපකො හි එත්ථ අභිසදෙද (ධ.ස.අ.2 පිටුව)
යැයි විස්තර කෙරේ. ඒ නිසා අභිධර්මය යනු සත්තිස් බෝධිපාක්ෂික ධර්මය පිලිබඳ විශේෂ වූ හා අතිරේක වූ විග්‍රහයකි. ඒ නිසාම එය ගැඹුරු

වූ පරමාර්ථ දේශනාවකි. අභිධම්මපිටකයට අයත් "පකරණ" නම් වූ ග්‍රන්ථ 7 ක් ඇත. ධම්මසංගණී, විභංග ධාතුකථා පුග්ගලපඤ්ඤත්ති, යමක පට්ඨාන, කථාවත්ථු යනු සත්තපකරණයයි. එයින් ප්‍රථම ධම්මසංගණිප්පකරණය අභිධර්මයේ කේන්ද්‍රයයි. එහි විස්තර වන්නේ සියුම් වූ ඥාණයන්ට ගෝචරවන්නා වූ ගැඹුරු ධර්ම කරුණු පිළිබඳවයි. ඒ නිසා එය "ධම්මසංගහො හෙවත් ධර්මසංග්‍රහයක්" වශයෙන් සුමංගල විලාසිනී නම් දීඝනිකායටඨ කථාවේදී (දී.නි.අ.12 පිටුව) හඳුන්වා ඇත.

ධම්මසංගණීප්පකරණයේ විග්‍රහ කෙරෙන ධර්ම කරුණු සංග්‍රහය නම් රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන නාම රූප ධර්මයෝය. මේ මාතෘකා 164 දක්වෙන්නේ "කුසලා ධම්මා, අකුසලා ධම්මා, අව්‍යාකතා ධම්මා" ආදී වශයෙන් මාතෘකා පමණක් දැක්වීමකි.ඒ මාතෘකා පසුව ඇති චිත්තුප්පාද කාණ්ඩයේ විස්තර වන්නේ කාමාවචර, රූපාවචර, අරූපාවචර, හා ලෝකෝත්තර යන සිත් පිළිබඳවයි.දෙවන රූප කාණ්ඩයෙහි අටවිසි රූප පිළිබඳ විග්‍රහ කෙරේ. නික්ඛෙප කාණ්ඩයෙන් විස්තර කෙරෙන්නේ මූල, ස්කන්ධ, ද්වාර, භූමි, අර්ථ, ධර්ම, නාම, ලිංග යන කරුණුය. අවසාන අට්ඨකථා කාණ්ඩයේදී මුලින් විස්තර කරන ලද ධර්ම කරුණු හා ඒවායේ අටුවා පිළිබඳ විස්තර වල සාරාංශයක් දැක්වේ.

## විභංග ප්‍රකරණය

විභංග ප්‍රකරණයෙන් කෙරෙන්නේ ස්කන්ධ, ධාතු, ආයතන, සච්ච, ඉන්ද්‍රිය, ආදිය විග්‍රහ කරමින් විභාග කිරීමයි.එහි විභංග හෙවත් පරිච්ඡේද 18 ක් ඇත. එම විභංග 18 හි බුදුදහමේ අන්තර්ගත ධර්ම කරුණු රාශියක් ඉතා ගැඹුරින් විග්‍රහ කෙරේ.

## ධාතුකථාප්පකරණය

"ධාතු" නම් ස්වභාව ධර්මයයි. එනිසා ස්වභාව ධර්මය පිළිබඳ විස්තර කෙරෙන ග්‍රන්ථය "ධාතුකථාප්පකරණයයි" එහිදී ස්කන්ධ, ධාතු, ආයතන ආදී සියලුම ධර්ම වල ඇති සම්බන්ධතාවද සිත හා චෛතසික වල පවතින අභ්‍යන්තර සම්බන්ධතාවද විස්තර කෙරේ.

## පුග්ගල පඤ්ඤත්තිපකරණය

බුද්ධ දේශනා වල සඳහන් වෙන සියලුම පුද්ගලයන් පිළිබඳ තත්ත්ව විග්‍රහ හා විවරණ "පුග්ගල පඤ්ඤත්තිපකරණයෙහි" අන්තර්ගත වේ. පැනවීම, ප්‍රකාශ කිරීම, නම් වූ පඤ්ඤත්ති වලින් විස්තර කර දක්වෙන්නේ ස්කන්ධ, ආයතන, ධාතු, සච්ච, ඉන්ද්‍රිය, හා පුද්ගල වශයෙන් පරිච්ඡේද 6 කින් පුද්ගලයන් පිළිබඳ පරමාර්ථ විග්‍රහයකි

## ධාතුකථාප්පකරණය

ධාතුකථාප්පකරණයේ විස්තර වන්නේ විවිධ ධර්ම කරුණු සහ බුදුදහමට විරුද්ධව නැගී ආ නොයෙක් මතවාද පිළිබඳයි. විවිධ මත හා එම මත ඛණ්ඩනය කිරීම කෙරෙන්නේ ප්‍රශ්න හා පිළිතුරු වශයෙන්ය. එහි වගග හෙවත් පරිච්ඡේද 23 ක වාද කථා 217 ක් ඇත.

## යමකප්පකරණය

යමක හෙවත් යුගල වශයෙන් ගෙන මෙහි ධර්ම කරුණු විස්තර කෙරේ. යමකප්පකරණයේ පරිච්ඡේද 10 ක් ඇත. මේ පරිච්ඡේද වල විග්‍රහ වෙන ධර්ම කරුණු සියුම් නුවණට පමණක් විෂය වන දහම් විවරණය, එනිසා යමකය දැක්වෙන පඤ්ඤත්ති පවත්ති, පරිඤ්ඤවාර යන විග්‍රහ සහ ඒවායේ උද්දේස හා නිද්දේස විග්‍රහය අවබෝධ කර ගැනීම පහසු නොවේ.

## පට්ඨානප්පකරණය

විවිධ ධර්ම වල ඉපදීමට හා පැවැත්මට හේතු වන ප්‍රත්‍ය 24 ක් මෙහි විග්‍රහ කෙරේ. එය නානාප්‍රකාර ප්‍රත්‍ය මගින් ප්‍රකාශ කෙරෙන නිසා පට්ඨානප්පකරණ නම් වෙයි. "යම් ධර්මයක් වෙනත් යම් ධර්මයක් අත් නොහැර පවතිද එම ධර්මය අනෙකට පච්චය වෙයි." මෙසේ එකක් අනෙකට ප්‍රත්‍ය වන ධර්ම 24 ක් පට්ඨානප්පකරණයේ විග්‍රහ වේ. ඒවා හේතු, ආරම්මණ, අධිපති, අනන්තර, සමනන්තර සහජාත අඤ්ඤමඤ්ඤ, නිස්සය, උපනිස්සය, පුරෙජාත, පච්ජාත, ආසේවන, කම්ම, විපාක, ආහාර, ඉන්ද්‍රිය, ඣාන, මග්ග, සම්ප්‍රයුත්ත, විප්පයුත්ත, අත්ථි, නත්ථි, විගත, අවිගත, යයි සූවිසි පච්චය නමින් හැඳින්වේ.

මේ ත්‍රිපිටක ධර්ම ග්‍රන්ථ ආරක්ෂා කරන ලද්දේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරා විසින් කටපාඩමින්ය. ඒ වනපොත් කළ පරම්පරා දීඝ භාණක, මජ්ඣිම භාණක, සංයුක්ත භාණක, තෙපිටක භාණක, අභිධම්ම භාණක, ආදී වශයෙන් හඳුන්වන ලදී.භාණකවරුන් පිළිබඳ විස්තර අට්ඨකථා, සන්න හා ගැටපද පොත්වල සඳහන් වේ.

අකුරු 8 ක් පාදයකි. පාද 4 ක් ගාථාවකි. ගාථාවක අකුරු 32 කි. එය ග්‍රන්ථයකි. ග්‍රන්ථ 250 ක් බණවරකි. බණවරක අකුරු 800 කි. මෙසේ බුද්ධ දේශනාව අක්ෂර, පාද, ගාථා, ග්‍රන්ථ, බණවර ආදී වශයෙන් බෙදු කොටස් කරමින් කටපාඩමින් නිවැරදිව ආරක්ෂා කරන ලද්දේ ථේරවාදී භික්ෂූන් විසිනි. විනයධර වූ උපාලි මහරහතන් වහන්සේගේ ශිෂ්‍ය පරම්පරා වලට අයත් දසක, සෝණක, සිග්ගව, මොග්ගලිපුත්තතිස්ස යන රහතන් වහන්සේලා 'ගෙන් මිහිඳු හිමියන්ටත් උන් වහන්සේගෙන් අරිට්ඨ ආදී ලාංකික භික්ෂූන්ටත් මේ ධර්ම විනය ලැබුණි.

අරිට්ඨ ආදී ලාංකික භික්ෂූහු පෙළ දහම නිවැරදිව ආරක්ෂා කල අතර ඒ පෙළ දහමේ අර්ථ නිවැරදිව හා නොවෙනස්ව ආරක්ෂා කිරීමට උත්සාහවත් වූහ. ඒ අනුව පෙළ ග්‍රන්ථ වල අන්තර්ගථ සූත්‍ර වල දුරවබෝධ ස්ථාන පැහැදිලි කරමින් හෙළ අටුවා සකස් කෙරිණි.මිහිඳු මහරහතන් වහන්සේගේ උපදෙස් පරිදි මේ හෙළ අටුවා හෙළ බසින් සකස් කරන ලද්දේ අරිට්ඨ ආදී මහරහතන් වහන්සේලා විසිනි. ඒවා මහට්ඨකථා, මහපච්චරි අට්ඨකථා, කුරුන්දි අට්ඨකථා, අන්ධටඨකථා ආදී වශයෙන් ද හැඳින්වේ. මේ හෙළ අටුවා පාලි බසට පරිවර්තනය කරන ලද්දේ ක්‍රි.ව.5 ශත වර්ෂයේදී බුද්ධඝෝෂාචාර්යයන් වහන්සේ විසිනි

මෙසේ හෙළ අටුවා ඇසුරු කරමින් බුද්ධඝොෂාචාර්යන් වහන්සේ විසින් සූත්‍ර, විනය හා අභිධර්ම යන තුන් පිටකයටම හෙළ අටුවා ඇසුරු කරගෙන අට්ඨකථා ලියන ලදී. ඒ අට්ඨකථා වලින් කරන්නේ පෙළ පොත් වල අන්තර්ගත සූත්‍රවල දුරවබෝධ තැන පැහැදිලි කිරීමයි. දීඝ නිකායේ බ්‍රහ්මජාල ආදී සූත්‍ර 34 ට විස්තර සපයමින් ලියන ලද අට්ඨකථාව, "සුමංගල විලාසිනී" නම් විය. ධම්ම පදයේ ගාථා විස්තර කරමින් ඒවා දේශනා කිරීමට හේතු වූ නිධාන කථාත් ඇතුළත් කරමින් "ධම්මපදට්ඨකථාව" ලියන ලදී.

මෙසේ බොහෝ පෙළ පොත් වලට හෙළ අටුවා ඇසුරු කරමින් බුද්ධඝෝෂ හිමියෝ අට්ඨකථා ලියූහ. උන්වහන්සේට අවසන් කිරීමට නොහැකි වූ ඉතිරි වූ පෙළ පොත් වලට ධම්මපාල, උපදේස, මහානාම, බුද්ධදත්ත ආදී මහ තෙරවරු අටඨකථා ලියූහ.

මේ අට්ඨකථා වලත්, සමහර තැන් අවබෝධකර ගැනීමට අපහසුය. එවැනි ගැටලු තැන් පැහැදිලි කරමින් ග්‍රන්ථිපාද ටීකා හා අනුටීකා ලියන ලදී. පොළොන්නරු යුගයෙ වැඩ විසූ සාරිපුත්‍ර හිමියන් විසින් "සාරත්ථදීපනී" නම් ටීකාව ලියන ලද්දේ සමන්තපාසාදිකා නම් දීඝනිකාය අට්ඨකථාවේ දුරවබෝධ තැන් විස්තර කිරීම සඳහාය.එසේම වජිරබුද්ධි, කස්සප,බුද්ධනාග, ධම්මපාල, ආනන්ද, වනරතන ආදී තෙරවරු අටඨකථාවල දුරවබෝධ තැන් පැහැදිලි කරමින් ටීකා, අනුටීකා ලියූහ.

මෙසේ බුද්ධ කාලයේ සිටම ථේරවාදී මහ තෙරවරු "බුද්ධ වචනය" නිවැරදිව ආරක්ෂා කිරීමට මහත් උත්සාහයක් ගතහ. ඒ උත්සාහය නිසාම අටඨකථා, ටීකා, අනුටීකා, මධුටීකා, ග්‍රන්ථිපද, සන්න ආදී වශයෙන් ත්‍රිපිටක ධර්ම ග්‍රන්ථ රාශියක් බිහිවිය. ඒ සියල්ල ත්‍රිපිටක සාහිත්‍ය ග්‍රන්ථ වශයෙන් හැඳින්විය හැකිය.

# බුද්ධ වචනය

## ත්‍රිපිටක

### විනය පිටකය

දේශනා සාසන කථාව සේන තිවිධං
1. ආණ දේශනා
2. යථාපරාධ සාසනං
3. සංවරා සංවර කථා

පාලි වසේන පඤ්චවිධං
1. පරාජිකා පාලි
2. පාචිතත්‍ය පාලි
3. මහාවග්ග පාලි
4. චුල්ලවග්ග පාලි
5. පරිවාර පාලි

### සුත්ත පිටක

දේශනා - සාසන කථා වසේන තිවිධං
1. වෝහාර දේසනා
2. යථානුලෝමසාසන
3. දිට්ඨිවිනිවෙඨන කථා

නිකාය වසේන පඤ්චවිධං
1. දීඝ නිකාය
2. මජ්ඣිම නිකාය
3. සංයුක්ත නිකාය
4. අංගුත්තර නිකාය
5. ඛුද්දක නිකාය

ඛුද්දක නිකාය
1. ඛුද්දක පාඨ
2. ධම්ම පද
3. උදන
4. ඉතිවුත්තක
5. සූත්ත නිපාත
6. විමාන වත්ථු
7. පේත වත්ථු
8. ථේර ගාථා
9. ථේරි ගාථා
10. ජාතක
11. නිද්දේස
12. පටිසම්භිද මග්ග
13. අපදන
14. බුද්ධ වංශ
15. චරියා පිටක

### අභිධම්ම පිටක

දේශනා සාසන කථා වසෙන තිවිධං
1. පරමත්ථ දෙශනා
2. යථා ධම්ම සාසනං
3. නාම රූප- පරිච්ඡේද කථා

පකරණ වසේන සත්ත විධං
1. ධමම සංගනී
2. විභංග
3. ධාතු කථා
4. පුග්ගල- පඤ්ඤති
5. කථා වත්ථු
6. යමක
7. පට්ඨාන

| බුද්ධ දේශනාව | පෙළ පොත් | අට්ඨ කථා | ටීකා |
|---|---|---|---|
| 1. සූත්‍ර පිටකය | දීඝ නිකාය සූත්‍ර 34 කථා - බුද්ධඝෝෂ හිමි | සුමංගල විලාසිනී නාම දීඝනිකාටඨ දීඝ - නිකායටඨකතා | ලීනත්ථපප කාසිනීනාම ටීකා ධම්මපාල හිමි |
| | මජ්ඣිම නිකාය සූත්‍ර 152 | පපඤ්ච සූදනීනාම මජ්ඣිම නිකායටඨකථා - බුද්ධඝෝෂ හිමි | මජ්ඣිම නිකායට්ඨ කථා - ධම්මපාල හිමි |
| | සංයුත්ත නිකාය 7762 | සාරත්ථපපකාසිනී නාම සංයුත්ත නිකායටඨකථා - බුද්ධඝෝෂ හිමි | සංයුත්තනිකාට්ඨකාථා ටීකා - ධම්මපාල හිමි |
| | අංගුත්තර නිකාය සූත්‍ර | මනෝරථපූරණී නාම අංගුත්තර නිකායටඨකථා - බුද්ධඝෝෂ හිමි ටීකා - සාරිපුත්ත හිමි | සාරත්ථමඤ්ජුසානාම අංගුත්තර නිකාය |
| 2. විනය පිටකය | පරාජිකාපාලි පාචිත්තියපාලි පරිවාරපාලි මහාවගගපාලි චුලලවග්ගපාලි | සමන්තපාසාදිකානාම විනයට්ඨකථා- බුද්ධඝෝෂ හිමි | සාරත්ථදීපනී නාම සමන්තපාසාදිකා ටීකා- සාරිපුත්ත හිමි පීරබුද්ධිනාම -සමන්තපාසදිකා ටීකා- වජිරබුද්ධි හිමි විමතිවිනෝදනීනාම සමන්තපාසාදිකා ටීකා- කස්සප හිමි විනයත්ථමඤ්ජුසානාම කංඛාවිතරනී ටීකා- බුද්ධනාග හිමි |
| 3.අභිධර්මපිටකය | ධම්මසංගනීපපකරණය | අත්ථසාලිනීනාම - ධම්මසංගණී අට්ඨකථා - බුද්ධඝොෂහිමි | ලීනත්ථපදවණ්ණනානාම මූලා ටීකා ආනන්ද වනරත්න හිමි |
| | විභංගපපකරණය බුද්ධඝෝෂ හිමි | සම්මෝහවිනෝදනී නාම විභංටඨකථා | විභංගත්ථපදවණ්ණනානාම අනු ටීකා ආනන්ද වනරත්න හිමි |
| | ධාතුකථාපපකරණය පුගගලපඤ්ඤතිපපකරණය කථාවත්ථුපපකරණය යමකපපකරණය පටඨානපපකරණය | පරමත්ථදීපනීනාම පඤ්ඥප්කරණටඨකථා බුද්ධඝොෂ හිමි | |

රුහුණු විශ්ව විද්‍යාලයේ සිංහල අධ්‍යන අංශයේ මහාචාර්ය
කෝන්ගස්තැන්නේ ආනන්ද හිමියන් විසිනි.

## සිත් රිදවන සියලු වචන

# පරුෂ වචන නම් වෙයි.

පරුෂා වාචා වේරමණි ශික්ෂාපදන් සමාදියාමි, යන ශික්ෂාපදයේ පරුෂ වචනය දස ආකාරයකින් විස්තර කර ඇත. එමෙන්ම අංග තුනක් සම්පූර්ණ වීමෙන් පරුෂ වචන කර්මය සිදුවේ.

1. අක්‍රෝශ කළයුතු කෙනෙකු වීම.
2. ක්‍රෝධ සහගත සිත් ඇතිවීම.
3. අනුන්ගේ සිත් රිදවන වචන කිම.

## අක්‍රෝශ කිරීමේ ආකාර දශය

අක්‍රෝශ කිරීමේ ආකාර දශයක් විනය පිටකයේ පාචිත්තිය පාළියේ දක්වා තිබේ. ජාතියෙන් අක්‍රෝශ කිරීමය, නාමයෙන් අක්‍රෝශ කිරීමය, ගෝත්‍රයෙන් අක්‍රෝශ කිරීමය, කර්මයෙන් අක්‍රෝශ කිරීමය, ශිල්පයෙන් අක්‍රෝශ කිරීමය, ආබාධයෙන් අක්‍රෝශ කිරීමය, ලිඞ්ගයෙන් අක්‍රෝශ කිරීමය, ක්ලේශයෙන් අක්‍රෝශ කිරීමය, ආපත්තියෙන් අක්‍රෝශ කිරීමය, අක්‍රෝශයෙන් අක්‍රෝශ කිරීමය යනු ඒ දශයය. ඒ සියලුම ආකාරයෙන් කරන අක්‍රෝශවලින් පරුෂ වචන කීමේ පාපය වේ.

(1). පහත් යයි සම්මත ජාති ඇතියකුට අවමන් කරනු පිණිස රිදවනු පිණිස ඔහුගේ ජාතියේ නමගෙන කතා කිරීම ද, උසස් යයි සම්මත ජාති ඇතියකුට රොඩියා පද්දු යන ආදීන් පහත් ජාතියක නාමයෙන් කතා කිරීමද, පහත් යයි සම්මත ජාතියක කෙනෙකුට අවමන් කරනු පිණිස නිළමේ රාළහාමි අප්පුහාමි යනාදීන් උසස් ජාති ඇතියන්ට කියන නාමයන්ගෙන් කතා කිරීමද ජාතියෙන් අක්‍රෝශ කිරීමය.

(2). ලෝකයෙහි ඒ ඒ පෙදෙස් වල උසස් කොට සළකන්නාවූ ද පහත් කොට සලකන්නා වූ ද නොයෙක් නම් ඇත්තේය. පහත් යයි සම්මත නමක් ඇතියකුට නිග්‍රහ කරනු පිණිස ඒ නම ගෙන කතා කිරීමද උසස් කොට සලකන නම් ඇතියකුට නිග්‍රහ පිණිස පහත් නමක් කීමද, පහත් යයි සම්මත නමක් ඇතියකුට නිග්‍රහ පිනිස උසස් නමක් ගෙන කතා කිරීම ද, "කරෝලියා ජුවානියා යනාදී නිග්‍රහ පිණිස නම නරක් කොට කතා කිරීමද නාමයෙන් අක්‍රෝශ කිරීමය.

(3). ගෝත්‍ර යනු ඒ ඒ ජාති වල අයට වෙන් වෙන් වූ නම් වලින් ඇත්තා වූ පරම්පරාවෝය. පහත් යයි සම්මත ගෝත්‍රයක කෙනෙකුට නිග්‍රහ පිණිස ඒ ගෝත්‍රයේ නම ගෙන කතා කිරීමද උසස් යයි සම්මත ගෝත්‍රයක කෙනකුට නින්ද කරනු පිණිස පහත් ගෝත්‍ර නාමයක් ගෙන කතා කිරීම ද, පහත් ගෝත්‍රයක් ඇතියකුට අවමන් කරනු පිණිස උසස් ගෝත්‍රයක නමක් ගෙන කතා කිරීම ද ගෝත්‍රයෙන් අක්‍රෝශ කිරීමය.

(4). ඒ ඒ ජනපද වල උසස් කොට සලකන කර්මාන්තද ඇත්තේය. පහත් කොට සලකන කර්මාන්තද ඇත්තේය. කසළ ඉවත් කිරීම, වැසිකිළි ශුද්ධ කිරීම ආදී හීන කර්මයක් කරන්නකුට අවමන් කරනු පිණිස එය ගෙන කතා කිරීම ද, වෙළඳාම් ගොවිකම් ආදී උසස් කර්මාන්තයක් කරන්නකුට අවමන් කරනු පිණිස උසස් කර්මයක් ගෙන කතා කිරීමද කර්මයෙන් අක්‍රෝශ කිරීමය.

(5). ඒ ඒ ජනපද වල උසස් කොට සලකන්නා වූ ද පහත් කොට සලකන්නා වූ ද ශිල්පයෝ වෙති. වළන් තැනීම, වට්ටි පෙට්ටි විවීම ආදී පහත් යයි සම්මත ශිල්පයකින් ජීවත් වන්නෙකුට නින්ද කරනු පිණිස කුඹලා, කුළුපොත්තා යනාදීන් කතා කිරීම ද, පහත් ශිල්පයකින් ජීවත් වන්නෙකුට අවමන් කරනු පිණිස ලියනමහත්මයා, වෙදමහත්මය යනාදීන් කතා කිරීමද ශිල්පයෙන් අක්‍රෝශ කිරීමය.

(6). යම්කිසි ආබාධයක් ඇතියකුට නින්ද කරනු පිණිස කබරයා, පරංගියා, ලාදුරුවා, හොරිකඩයා යනාදීන් කතා කිරීමද, එබඳු ආබාධයක් නැතියකුට නින්ද පිණිස එසේ කතා කිරීම ද ආබාධයෙන් අක්‍රෝශ කිරීමය.

(7). කල්ලා, රත්තා, සුද්ද, දිගා, මිට්ටා, තඩියා යනාදීන් ශරීරාකාරය ගෙන අනුන්ට අපහාස කිරීම ලිඞ්ගයෙන් අක්‍රෝශ කිරීමය.

8). පෙරේතයා, මසුරා, සල්ලාලයා, කොටියා, යකා, ගොනා යනාදීන් අපහාස කිරීම ක්ලේශයෙන් අක්‍රෝශ කිරීමය

.

(9). කළා වූ හෝ නොකළා වූ හෝ වරදක් ගෙන අපහාස කිරීම ආපත්තියෙන් අක්‍රෝශ කිරීමය.

(10). ලෝකයෙහි අනුන්ට රිදවනු පිණිස අපහාස කරනු පිණිස කියන්නා වූ නොයෙක් වචන ඇත්තේය. ගොනා, ඌරා, බල්ලා, බෙබද්ද, සල්ලාලයා යනා දී සිත රිදවන්නා වූ යම් කිසි වචනයකින් නිග්‍රහ කිරීම අක්‍රෝශයෙන් අක්‍රෝශ කිරීමයි.

*රේරුකානේ චන්දවිමල මහනාහිමියන්ගේ කෘතියක් ඇසුරිනි.*

## දාන හතරක කුසල විපාක ධර්මයෙහි මෙසේ සඳහන් වේ.

(01) තමන්ගේ ධනයෙන් දන්දෙන අතර අන්‍යන් ඊට සහභාගී කර නොගනී. ඒ හේතුවෙන් ඒ අයට මතු භෝග සම්පත් ලැබෙන අතර පරිවාර සම්පත් නොලැබී යයි

(02) තම ධනය වියදම් නොකොට බොහෝ පිරිස් එකතු කරගෙන ඒ අයගේ ධනයෙන් දන්දීමේ හේතුවෙන් මතු ධන සම්පත් නොලැබෙන අතර පිරිවර සම්පත් ලැබෙනු අත.

(03) තමාද දන් නොදෙන අතර දෙන දානයටද සහභාගී නොවීම හේතුවෙන් මතු ධන සම්පත්ද පිරිවර සම්පත්ද යන දෙකම නොලැබී යයි.

(04) තම ධනයද යොදා අන් අයද ඊට සහභාගී කරගෙන දෙන දානය හේතුවෙන් මතු ධන සම්පත් ද පිරිවර සම්පත් ද යන දෙකම ලැබෙනු ඇත ශ්‍රද්ධාව අවදිකරගෙන නුවනින් යුක්තව එකග වූ නොවිසිරුනු සිතින් දෙන පුන්චි දෙයක් වුවද මහත් ඵලවන බව පෙන්වීමට අපදාන පාලියට අනුව කරුනු පෙන්ව දෙමි.

බුද්ධත්වය පතා පාරමී පිරූ ගෞතම බෝධිසත්වයන් වහන්සේ

## අවසන් ආත්ම

පන්සිය හතළිස් හත මෙසේ උපත ලබා ඇත.

| | | | |
|---|---|---|---|
| මනුෂ්‍ය ආත්ම | - 345 | මත්සව ආත්ම | - 03 |
| බ්‍රහ්ම රාජම ආත්ම | - 05 | ගරුඩව ආත්ම | - 02 |
| ශක්‍ර දිව්‍ය රාජව ආත්ම | - 20 | කිඳුරව ආත්ම | - 01 |
| වෘක්ෂ දිව්‍ය රාජව ආත්ම | - 31 | මොණරව ආත්ම | - 03 |
| සාමාන්‍ය දිව්‍ය රාජව ආත්ම | - 14 | හංසව ආත්ම | - 08 |
| සිංහ රාජ ආත්ම | - 10 | සක්වා ළිහිණි ආත්ම | - 02 |
| හස්තිරාජ ආත්ම | - 07 | කකුළුව ආත්ම | - 02 |
| අශ්වරාජ ආත්ම | - 04 | ගිරාව ආත්ම | - 09 |
| මහිස රාජ ආත්ම | - 01 | ගිජුළිහිණි ආත්ම | - 04 |
| වෘෂභ රාජ ආත්ම | - 05 | කවුඩුව ආත්ම | - 02 |
| බැටළු ආත්ම | - 03 | කාල හංසව ආත්ම | - 01 |
| මෘගව ආත්ම | - 08 | කොවුල්ව ආත්ම | - 02 |
| සූකරව ආත්ම | - 01 | කොට්ටෝරුව ආත්ම | - 02 |
| වඳුරුව ආත්ම | - 12 | පරවිව ආත්ම | - 06 |
| සුනඛව ආත්ම | - 03 | ලෙහෙනුව ආත්ම | - 01 |
| සසව ආත්ම | - 01 | වටුව ආත්ම | - 04 |
| සෝධව ආත්ම | - 03 | කැටකුරුළුව ආත්ම | - 01 |
| මූසිකව ආත්ම | - 02 | ගේකුරුළුව ආත්ම | - 01 |
| මණ්ඩුකම් ආත්ම | - 01 | සාමාන්‍ය පක්ෂි ආත්ම | - 03 |



# මිරිසවැටිය සලපතල මළුව ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය

මෙත්සවිය විසින් ආරම්භ කරනු ලැබූ තවත් පිං බර ව්‍යාපෘතියක් වන මිරිසවැටිය මහා චෛත්‍යයේ සලපතල මළුවේ ගල් අල්ලා කරණ ප්‍රතිසංස්කරණ කටයුතු මේ දිනවලදී සාර්ථකව කරගෙන යනු ලබයි. අප සංසදයේ නිලධාරි පිරිස සමග 200 පමණ සාමාජික සාමාජිකාවන් පිරිසක් නොබෝද මෙම කටයුතු අධීක්ශණය කිරිම සඳහා එම ස්ථානයට ගොස් මෙම පිංකමට දයකවු පිංවතුන්ගේ ආධාරමුදල් වලින් කොටසක් දැනට නිම කර ඇති වැඩ වල ගාස්තු පියවීම සඳහා බාරදීමද සිදුකෙරුණි.

මෙම පුණ්‍ය කර්මය අප සංසදයේ සියළු දෙනාටම ලැබුණු දුර්ලභ අවස්ථාවක් බැවිද සිහිපත් කළ යුතුයි. මක්නිසාද යත් වසර 2150 මුළුල්ලේ මෙම කර්තව්‍ය කිසිම රජකෙනෙකුට හෝ වර්ථමාන රාජ්‍ය නායකයකුට හෝ කරගත නොහැකි කටයුත්තක් ව තිබූ නිසායි.

නොයෙකුත් අවස්ථා වලදී යම් යම් රජවරු සහ වෙනත් පාලකයින් මේ සඳහා මුල පිරුමුත් විධිමත්ව ආරම්භ නොකළ නිසා සෑම අවස්ථාවකදීම විවිධ අන්දමේ කරදර පැමිණ එම කටයුතු කරගෙන යාමට නොහැකි අන්දමින් අඩාල වී සමහර නායකයින්ගේ තනතුරු පවා අහිමි වී ගිය බව වාර්ථා වුණි.

චෛත්‍ය ප්‍රතිසංස්කරණය ගැන පවසන විට හිටපු ජනාධිපතිවරයෙකු වන ජේ.ආර්.ජයවර්ධන මහතා මෙහි ප්‍රතිසංස්කරණ කටයුතු 1979 වසරේ ආරම්භ කර සම්පූර්ණ උස අඩි 209 වනසේ නිමා කලත් එය 1987 දී සම්පූර්ණයෙන් කඩා වැටුණි. ප්‍රේමදස ජනාධිපතිතුමා ඉන් අනතුරුව මේ සඳහා මැදිහත් වූවත් ඔහුටද එය සම්පූර්ණයෙන්ම නිමා කල නොහැකි විය.

කෙසේ වුවත් අප සංසදයේ නිර්මාතෘ සහ ගරු සභාපති ආචාර්ය චන්දන ජයරත්න මහතාට මෙතෙක් ප්‍රතිසංස්කරණය නොකල සලපතල මළුවට මුල්ගල තබා ආරම්භ කිරීමේ ආශිර්වාදය ලැබීම නිසා අප සියළු දෙනාටද ඒ සඳහා දයකවීමේ මහඟු අවස්ථාව උදා විය.

මිරිසවැටිය මෙන්ම අතීතයේ ප්‍රාර්ථනා චෛත්‍ය නමින්ද හැඳින්වූ මෙම පුණ්‍ය භූමියට අරක්ගෙන සිටින සියළු දෙවි දේවතාවන්ගේ සහ වෙනත් බලවේගයන්ගේ පූර්ණ ආශිර්වාදයද ලබා ගැනීම නිසා මෙම කටයුතු මෙසේ සාර්ථකව කරගෙන යාමට හැකි වී ඇති බව මිරිසවැටිය විහාරස්ථානයේ නායක හිමියන් වන එතල වැටුනුවැව ඥානතිලක ස්වාමිද්‍රයානන් වහන්සේගේ ද, අදහස වී තිබේ.

අඩි 536 වට ප්‍රමාණයක් ඇති මෙම චෛත්‍ය රාජයානන් වහන්සේ මෙසේ වන්දනා කරමු.

"අභයරාජ සධාතුක කේතු වරං
සුනිධාය කතං බහුමානිතං
සකලහිතං පණ මේ සද
මිරිචවට්ටික චේතිය මුත්තමං"

අප දේශයේ අසහාය විමුක්ති දයකයානන් ලෙසින් ඉතිහාසයට එක්වී ඇති දුටුගැමුණු නරවිරුවාණන් විසින් ඉදිකල ප්‍රථම චෛත්‍ය මිරිසවැටියයි. මහාවංශයේ සඳහන් වන පරිදි දිනක් මහ රජතුමා මහා ජල ක්‍රීඩාවක් කරණු පිණිස උත්සවශ්‍රීයෙන් තිසාවැවට සම්ප්‍රාප්ත වූයේය. එම මොහොතට ගෙන එන ලද්ද වූ සියලු පරිභෝග භාණ්ඩද, සිය ගණන් පඬුරුද එක් ස්ථානයක තබා ජල ක්‍රීඩාවට ගියහ. කුන්තායුධය (සධාතුක ජය කොන්තය) උසුලන්නාවූ රාජ පුරුෂයෝ ධාතු සහිතව කුන්තායුධය එම ස්ථානයේම සෘජු කොට තැබූහ. සවස් භාගයේ ජල ක්‍රීඩා හමාර කොට මහ රජ තෙමේ රාජපුරුෂයින් අමතා "යනු කැමැත්තම්හ, කුන්තායුධය වඩවිය" කීය. රාජ පුරුෂයින්ට එම කුන්තායුධය සෙලවීමට නොහැකි විය.රජ තෙමේ මේ මහත් අශ්චර්ය දැක සතුටු සිත් ඇත්තේ, කුන්තායුධය සුවඳ මලින් පිදුහ.එහි ආරක්ෂා සංවිධානය කොට ධාතූන් සහිත කුන්තායුධය පරික්ෂිප්ත කරවා තුන් අවුරුද්දකින් මහා චෛත්‍යක් කරවා, භික්ෂූන් ලක්ෂයක් ද, භික්ෂුණීන් අනූදහසක් ද වඩම්වා සඟසතු කොට පූජා කළේය.

දුටුගැමුණු මහරජ තෙමේ මෙම චෛත්‍යයට නම් තැබීමේ දී සංඝයා සිහිනොකොට මිරිස් වැටියක් අනුභව කලාවූ වරදට දඬුවම් පිණිස මිරිසවැටිය නමින් නම් තැබූ බැව් මහා සංඝරත්නය හමුවේ ප්‍රකාශ කල බවත් සඳහන් වේ.

අතීතයේ දී මෙම චෛත්‍ය ප්‍රාර්ථනා චෛත්‍ය නමින් හඳුන්වා ඇත්තේ දුටුගැමුණු මහරජ තෙමේ තම සුවිශේෂ කාර්යයන් සඳහා යන විට මෙම චෛත්‍යයට ප්‍රාර්ථනා කොට භාර වීම හේතු කොට යැයි ද ජනවහරේ සඳහන් වේ.

සටහන - සංස්කාරකගෙනි.



# මිරිසවැටිය සලපතල මළුව ප්‍රතිසංස්කරණය සඳහා මෙතෙක් ලැබිඇති ආධාර මුදල්.

(31/12/2007 දක්වා රු.10000 වඩා වැඩි.)

| | | |
|---|---|---|
| සරත් ඉලන්ගන්තිලක මයා | (1-168) | රු:200000 |
| සමන්ති අහුබුදු මිය | (5-941) | රු:105000 |
| ආචාර්ය චන්දන ජයරත්න මයා | (001) | රු:100000 |
| අමරපාල පෙරේරා මයා | (1-001) | රු:100000 |
| අබේරත්න බණ්ඩාර මයා හා මිය | (7-1264) | රු:100000 |
| ඊ.සී. ද සිල්වා මයා | (10-1046) | රු:50000 |
| නෙලී ද සිල්වා මිය අශෝමා, වසන්ති, දයානි මෙනෙවිය | | රු:50000 |
| රංජිත් සොයිසා හා මිතුරන් | (3-622) | රු:50500 |
| තුසිත දෙඩංගොඩ මයා | (1-104) | රු:26000 |
| සුනීතා කන්නන්ගර මිය | (1928) | රු:25000 |
| වෛද්‍ය ලලනි ගයත්‍රි මිය | (7-1372) | රු:22500 |
| සුලාලි-සුබුල් ප්‍රේමරත්න කුමරියන් | | රු:22100 |
| ප්‍රියවතී කඳනආරච්චි මිය | (502) | රු:13600 |
| චම්පා වීරසිංහ මිය | (8-1428) | රු:11000 |
| මානෙල් කුමාරතිලක මිය | (7-1243) | රු:10000 |
| ස්වර්ණා ගුණසේකර මිය | (2-419) | රු:10000 |
| චන්ද්‍රිමා වල්ගමගේ මෙනෙවිය | (1-190) | රු:10000 |
| ගීතා මල්කාන්ති රණසිංහ මිය | (10-1895) | රු:10000 |
| චමිල ප්‍රසන්න මයා | (9-1575) | රු:10000 |
| ඩබ්.රණසිංහ මයා | (1-315) | රු:10000 |
| බී.වනිගබදු මහතා සහ මහත්මිය | (11-1957-11-1958 | රු:10000 |
| දමයන්ති වීරසිංහ මිය | (9-1747) | රු:8500 |
| අරිසෙන් අහුබුදු ශූරීන් | | රු:8500 |
| කොඩිතුවක්කු පවුල | (4-840-4-839) (5-1029-6-1165) | රු:8000 |
| උත්තරා විදානගමගේ මිය | (8-1556) | රු:7500 |
| ස්වර්ණා සුභවික්‍රම | (1817) | රු:7000 |
| අයි.සී. වීරසිංහ මිය | (1929) | රු:6000 |
| චමිලා, චතුරානි, සමුද්‍රා මෙනෙවියන් | (1070,1971 1972) | රු:5570 |
| එන්.කේ.පලිහක්කාර මිය | (1176) | රු:5000. |
| පද්මිණී විජේතුංග | (1642) | රු:5000 |
| පුෂ්පා ගුණරත්න මෙනෙවිය | (153) | රු:5000 |
| ජී.ජී.සුමනසේන මයා | (1593) | රු:5000 |
| චන්ද්‍රිකා ද සිල්වා මිය | (6-1118) | රු:5000 |
| පී.ඒ.එස්.පතිරාජ මයා | (8-1488) | රු:5000 |
| එන්.ඩී.විමලා විල්සන් මිය | (1584) | රු:5000 |
| කේ.එම්.චන්න සිල්වා මයා | (2154) | රු:5000 |
| එස්.පී.එම්.ද සිල්වා | | රු:5000 |
| සේපාලිකා වීරසිංහ | (9-1746) | රු:4000 |
| තරිඳු අමරසේකර | | රු:4000 |
| එස්.එම්.නදුන් තිළිණ ද සිල්වා | (1-108) | රු:3500 |
| සරෝජා පුෂ්පවංශ | | රු:3400 |
| කුසුමා ද සිල්වා | (9-1582) | රු:3400 |
| චන්ද්‍රානි ජයවර්ධන | (7-1243) | රු:3400 |
| ප්‍රියවතී කඳනාරච්චි | (2-502) | රු:3400 |
| එම්.ඒ.එල්.චන්ද්‍රලතා මිය | (1-351) | රු:3400 |
| ඒ.එම්.ඩී.අතපත්තු | (8-1461) | රු:3000 |
| මාලා පෙරේරා | | රු:3000 |
| මල්කා විජේසිංහ | (1-101) | රු:3000 |
| සුජිතා නාලිනී | | රු:3000 |
| සාමාජිකයන් | (1372/1420/ 1421) | රු:3000 |
| ජේ.ඩී.නිමල් චන්ද්‍රසිරි | | රු:3000 |
| එම්.ඒ.නෙලිකා තිලක්ෂි | (10-1828) | රු:3000 |
| එන්.කුසුමාවතී ද සිල්වා | (1582) | රු:3000 |
| මනෝරි විජේරත්න | (1670) | රු:2500 |
| එච්.අමරසිංහ | (10-1783) | රු:2000 |
| ඩී.ඩී.එස්.පතිරගේ | (9-1640) | රු:2000 |
| ඩබ්.ජී.රූපාවතී | (1-111) | රු:2000 |
| කේ.හේමා ගමගේ | (3-575) | රු:2000 |
| එම්.විජයලක්ෂ්මී රණසිංහ | (9-1577) | රු:2000 |
| ඩී.ජී.බණ්ඩාරනායක | (8-1382) | රු:2000 |

| | | |
|---|---|---|
| එම්.සී.මාතුපාල | (9-1600) | රු: 2000 |
| දර්ශනී රණසිංහ | (1-314) | රු: 2000 |
| චම්පා රෝහිණී | (11-2031) | රු: 2000 |
| එල්.ඒ.ආර්.තරංග | (9-1639) | රු: 2000 |
| එස්.ටී.ජයසූරිය | (9-1639) | රු: 2000 |
| එස්.එන්.ඔබේසේකර | (9-1672/ 9-167 | රු: 2000 |
| එච්.ඒ.ජයකොඩි | | රු: 2000 |
| රෝහිණී රොද්‍රිගෝ | | රු: 2000 |
| බන්දු අබේරත්න/අරුණි | | රු: 2000 |
| ඒ.පී.සුනීතා නාලිනී | (10-1870) | රු: 2000 |
| ඩී.ශ්‍යාමලී කරුණාරත්න | | රු: 2000 |
| ජානක සුවඳරත්න | (369) | රු: 2000 |
| සුමනා බාලසූරිය | (9-1727) | රු: 2000 |
| එස්.ජේ.බාලසූරිය | (10-1780) | රු: 2000 |
| දනුෂ්ක වික්‍රමබණ්ඩාර/ ප්‍රියාලතා කුරේ | (1-366 1-368) | රු: 2000 |
| මාලුටි පොතුහැර | | රු: 2000 |
| ක්‍රිශාන්ත ඉන්දික පෙරේරා | | රු: 2000 |
| පියවතී කඳනාරච්චි | (1-502) | රු: 1700 |
| ඒ.ජී.එම්.පෙරේරා/ඉන්ද්‍රා මාලතී | (1-228 1-229) | රු: 1700 |
| සුජාතා බොතේජු | (9-1712) | රු: 1700 |
| අතුල නානායක්කාර | (1-212) | රු: 1700 |
| චන්ද්‍රානි සේනාදීර | (10-1791) | රු: 1700 |
| එම්.කේ.සී.ඩී.රියෙන්සා | (3-547) | රු: 1700 |
| හේමා අල්ගම | (10-1818) | රු: 1500 |
| ඒ.කේ.කුසුමාවතී | (4-585) | රු: 1500 |
| ඒ.නිහාල් මෙන්ඩිස් | (3-686) | රු: 1500 |
| ජානක ප්‍රසන්න කුමාර | (6-1198) | රු: 1500 |
| ටී.අබේගුණවර්ධන | | රු: 1500 |
| එච්.ඩී.ඒ.ජයසිංහ/පද්මා ජයසිංහ | (10-1860) (1-292) | රු: 1500 |
| ඉන්ද්‍රානි සුභසිංහ | (2-381) | රු: 1300 |
| පී.ආර්.එන්.රත්නායක | (3-726) | රු: 1000 |
| චම්පා වීරසිංහ | (8-1428) | රු: 1000 |
| ඒ.එම්.ඩී.එන්.ජයමාන්න | (9-1681) | රු: 1000 |
| එස්.කටුගම්පල | (8-1529) | රු: 1000 |
| ඉනෝකා කුමාරි | (10-1767) | රු: 1000 |
| මහේන්ද්‍ර ද සිල්වා | | රු: 1000 |
| යූ.ඒ.එස්.මෙන්ඩිස් | (7-1248) | රු: 1000 |
| ඩී.එස්.එස්.ආර්.ගමගේ | (9-1685) | රු: 1000 |
| සී.ආර්.රණසිංහ | (5-936) | රු: 1000 |
| වජිරා චිත්‍රානි මෝතා | (1-293) | රු: 1000 |
| පියසිරි මාතරගේ | (8-1376) | රු: 1000 |
| වසන්ත රණවීර | (9-1628) | රු: 1000 |
| වී.අයි.වික්‍රමතිලක | (9-1618) | රු: 1000 |
| ජී.වී.ටී.පෙරේරා | (1-160) | රු: 1000 |
| එල්.කේමා සිල්වා | (10-1855) | රු: 1000 |
| ඉන්ද්‍රානි රත්නායක | (9-1734) | රු: 1000 |
| චන්ද්‍රිමා නාගහවත්ත | | රු: 1000 |
| ප්‍රේමා කොඩිතුවක්කු | (10-1867) | රු: 1000 |
| ප්‍රේමා සේරසිංහ | (7-1355) | රු: 1000 |
| ශාමා සමරදිව | (8-1472) | රු: 1000 |
| ඉරෝෂා ගුණසිංහ | (4-897) | රු: 1000 |
| දයානි රූපසිංහ | (4-815) | රු: 1000 |
| එන්.එස්.විදානගමගේ | (7-1242) | රු: 1000 |
| තේජා කරුණාරත්න | (5-1047) | රු: 1000 |
| සුජාතා මාතුපාල | (8-1418) | රු: 1000 |
| සමරවීර මහතා හා මහත්මිය | (8-1543) | රු: 1000 |
| බන්දුල ජයතිලක | | රු: 1000 |
| නන්දනී පුෂ්පා චන්ද්‍රලතා | | රු: 1000 |
| ජේ.වී.පතිරණ | | රු: 1000 |
| නිරෝෂන් හර්ෂ පතිරණ | | රු: 1000 |
| තිළිණ වනිගසේකර | | රු: 1000 |
| සෝමා සේනාධිලංකාර | (9-1705) | රු: 1000 |
| කේ.දමයන්ති | (8-1513) | රු: 1000 |
| නිවන්ති අයිමා | (3-698) | රු: 1000 |
| සීතා ගෝමස් | (3-642) | රු: 1000 |

| | | |
|---|---|---|
| පී.වී.සී.විතාරණ | (10-1792) | රු:1000 |
| දීපා සමරසිංහ | (1522) | රු:1000 |
| යූ.කේ.හෙට්ටිගේ | (1-103) | රු:1000 |
| මාදවී හේමසිරි | | රු:1000 |
| සුජාතා හේමසිරි | | රු:1000 |
| එච්.එම්.රේණුකා | (1114) | රු:1000 |
| එම්.ඩබ්.කරුණාවතී | (1470) | රු:1000 |
| ඩබ්.ඒ.එස්.ධම්මික | | රු:1000 |
| එන්.පී.ධර්මරත්න | | රු:1000 |
| එච්.පියසිලි | | රු:1000 |
| එම්.කුමාර් නහරනායක | | රු:1000 |
| ටී.පී.දිසානායක | | රු:1000 |
| එස්.බී.ඒ.සෙනෙවිරත්න | | රු:1000 |
| ලක්ෂ්මී තිලකරත්න | | රු:1000 |
| වී.පී.අයි.එල්.විතාන | | රු:1000 |
| චම්පා | | රු:1000 |
| සුජාතා දිසානායක | | රු:1000 |
| ජානකී විජේසිංහ | (11-1960) | රු:1000 |
| හේමා මහගම | | රු:1000 |
| මල්ලිකා ජයසේකර | (10-1801) | රු:1000 |
| පාරමී මාෂා ජයවර්ධන | (1288) | රු:1000 |
| ඩී.පී.ප්‍රමිතා මහේෂි | (10-1845) | රු:1000 |
| කුෂානි පීරිස් | (1762) | රු:1000 |
| බී.පද්මා මුණසිංහ | (1764) | රු:1000 |
| දයාවතී මැණිකේ | (1-134) | රු:1000 |
| රෝහිණී පුෂ්පලතා | (10-1884) | රු:1000 |
| එස්.සමරසිංහ | | රු:1000 |
| තිලුෂා සිරිවර්ධන | (10-1811) | රු:1000 |
| වත්සලා කොඩිතුවක්කු | (6-1165) | රු:1000 |
| ලීලානන්ද කොඩිතුවක්කු | (5-1029) | රු:1000 |
| එල්.එස්.කොඩිතුවක්කු | (4-840) | රු:1000 |
| ලක්ෂ්මී කොඩිතුවක්කු | (4-839) | රු:1000 |
| ඊ.වී.චන්ද්‍රා | (10-1775) | රු:1000 |
| බී.වනිගසේකර | | රු:1000 |
| කේ.චාන්දනී | (10-1814) | රු:1000 |
| ඉන්ද්‍රා ගුරුසිංහ | (10-1798) | රු:1000 |
| චතුරානි විජේසේකර | (10-1848) | රු:1000 |
| රංජිත් සමරසිංහ | (9-1673) | රු:1000 |
| පියසීලි දිසානායක | (6-1223) | රු:1000 |
| කාන්ති අබේරත්න | (2-396) | රු:1000 |
| වනිගබඩු මහතා හා මහත්මිය | (11-1957 11-1958) | රු:1000 |
| පී.වී.ඩී.කුරේ | (7-1299) | රු:1000 |
| අහන්ගම ආනන්ද හිමි | | රු:1000 |
| පුෂ්පා සෙනෙවිරත්න | (10-1879) | රු:1000 |
| උදය පෙරේරා | (10-1809) | රු:1000 |
| එච්.පී.පී.චන්ද්‍රලාල් | (4-733) | රු:1000 |
| සුමනා හපුහෙට්ටි | (9-1617) | රු:1000 |
| බී.ඩබ්.චමින්ද | (1-289) | රු:1000 |
| චම්පිකා ශිරෝමණී යාපා | (5-1021) | රු:1000 |
| ශ්‍යාමලී දමයන්ති කරුණානායක | (1569) | රු:1000 |
| කේ.කේ.කුලතුංග | (9-1581) | රු:1000 |
| එන්.සී.ඩී.යූ.ඩිලානි ගුණසේකර | | රු:1000 |

# මතුභවයට ගෙනයාහැකි ආභරණයක්.

කුසල කර්ම ගැන කථා කරන විට කර්මය හා කර්ම විපාකය යන නියාමයට අනුකූලව කෙරෙන කුසල කර්ම, ධ්‍යාන මුල් කර ගෙන කෙරෙන කුසල කර්ම සහ ප්‍රඥාව මුල් කර ගෙන කෙරෙන කුසල කර්ම යැයි තුන් වර්ගයකි.

කර්ම මාර්ගය, ධ්‍යාන මාර්ගය සහ ඥාණ මාර්ගය වශයෙන් මාර්ග තුනකි.මේ මාර්ග තුන සවිස්තරව විදහා දැක්වීම කළ යුතු දෙයකි.මේ එක් එක් මාර්ගයක් අනුව ගමන් කිරීමෙන් කෙතරම් ප්‍රතිඵල ලබා ගත හැකි වන්නේ ද යන්න වැඩිදුරටත් විස්තර කල යුතුය.

කර්ම මාර්ගයට අනුව ගමන් කිරීම, යනු දන කුසල් සහ සීල කුසල් කිරීම හැර වෙන අමුතු දෙයක් නොවේ. ධ්‍යාන මාර්ගයට අනුව ගමන් කිරීම යනු සමාධිය පහළ වන ආකාරයට භාවනා කිරීමෙන් රූප සහ අරූප ධ්‍යාන ලබා ගැනීමයි. ඥාණ මාර්ගයට අනුව ගමන් කිරීම යනු සතිපට්ඨාන භාවනාවට අනුව භාවනා කරන යෝගීන් නාම ධර්ම සහ රූප ධර්ම වෙන් වෙන් කොට දැන ගන්නා (නාම-රූප-පරිච්ඡේද) නුවණ තැන් පටන් ප්‍රත්‍යක්ෂ ඥාණ එකින් එක උපදවා ගනිමින් අවසානයේ නිවන් දක්වාම ගමන් කල හැකි ගමන් කළ හැකි ගමන් මාර්ගයේ යාමයි."දන" යන්න පිරිසිදු සිතින් දීම, මුදු හැරීම යන අර්ථ ගෙන දේ.මෙලෙස පිරිසිදු සිතින් දීම, මුදු හැරීම යන්න ත්‍යාගයක්, සම්මානයක් පිළිගැන්වීමේදී ද සිදුවේ. එහෙත් මෙහි දෙයාකාරයක් ඇත. දන කුසලය කරන අවස්ථාවෙහි වටිනාකම සුළු හෝ වේවා, විශාල හෝ වේවා, දෙයක් පූජා කරන මොහොතක් බැවින් අකුසල් තුරන් වී සුභ ඵල දෙන කුසල කර්ම විශාල වශයෙන් පහළ වේ.

වඩා වටිනා දන වස්තු, බර පැන තුබුණත් ඒ විෂයෙහි දන චේතනාව පිරිසිදු නොවුන හොත් එය නියම දනයක් නොවන්නේය. දන වස්තුව කෙරෙහි බැඳුණු ලෝභය පවතින්නේ නම් දනයක් නොවන්නේය. කුමන කාරණයක් නිසා හෝ වේවා දනයක් වීමට නම් තමා සතු එම වස්තුව කෙරෙහි ඇති බැඳීම දුරු කරලීම යනු එයට ඇති ලෝභය දුරු කර ලීම විය යුතුය. මේ ලෝභය දුරුවීම "පිරිසිදු වීම" යැයි ද "කෙලෙස් දුරු වීම"යැයි ද කියනු ලැබේ.මෙයම දන කුසලයයි.

මෙලෙස තමා විසින් දෙනු ලබන දන වස්තුව කෙරෙහි නොබැඳුණු සිතින් දනය දීම නිසා, විශේෂයෙන් නොපැතිය යුතු එහෙත් එහි විපාක වශයෙන් ලැබෙන ලෞකික සම්පත් කෙරෙහි අපේක්ෂා වශයෙන් ලොභය, අසාව පැන නැගිය හැකිය. මෙයද ප්‍රාර්ථනා නොකල යුතුය. ඒ වාගේම "මම ලොකු ධාන පතියෙක්මි, මම දනය දීමට පුළුවන් කම ඇත්තෙක්" යනා දී ලෙසට ප්‍රසිද්ධිය හෝ නම්බුව හෝ පිලිබඳ අදහස දනය ඇසුරෙන් පැන නැගිය හැකිය. එවැනි අවස්ථාවන්හි ද ලෝභ සිතිවිලි සිතින් තුරන් කළ යුතුය. එලෙස සම්පූර්ණයෙන්ම ලෝභයෙන් තොර වූ විට එයට පවිත්‍ර, පිවිතුරු කුසලය යැයි කියනු ලැබේ.

දනයක් දීමෙහි දී එය ප්‍රිය සිතින්, කරුණා සිතින්, පිවිතුරු සිතින් ම දිය යුතුය. එනම් තමන් සතු දන වස්තුව දීමෙන් "අනුන් සැපයට පත් වේවා" යන මෛත්‍රියත්, එසේම එම වස්තුව ලැබීමෙන් දුකින් පෙළෙන අය "එම දුකින් අත් මිදේවා"යන කරුණාවත් පදනම් වූ සිතකින් දනය දිය යුතුය. මෙසේ දනය දෙන මොහොතෙහි දී දෙන පුද්ගලයාගේ මෙන්ම තවත් බොහෝ දෙනාගේ ද සන්තානයන් හි ඇති පුහුප්සාජනක සිතිවිල්ලක් වූ ද්වේෂය ඉවත් වී යන්නේය. මෙම ද්වේෂයේ ඉවත් වී යෑම ම දන කුසලය වන්නේය.

මෙලෙස මෛත්‍රිය සහ කරුණාව පදනම් කර ගනිමින්, තම සන්තානයෙහි පවතින පුහුප්සාජනක ද්වේෂය දුරු කර දනය දීමෙන් දනය ලබන්නාගේ හෙවත් ප්‍රතිග්‍රාහකයාගේ ද, තම දන වස්තු මගින් කෙනෙකු සමෘද්ධියට පත් වනු දැකීමෙන් දයකයාගේ ද සිත් ප්‍රසාදයට පත් වන්නේය. ඒ අනුව නැති බැරි කමින් පෙළෙමින් සිටියකු එම තත්ත්වයෙනුත්, දුකට පත් වුවකු එම තත්ත්වයෙනුත් අත්මිදෙනු දැකීමෙන් තම සිත වඩාත් සතුටට පත් වන්නේය. මෙයට "මුදිතාව" යැයි කියනු ලැබේ. අනුන් සැප සම්පතින් සම්පූර්ණවනු දැක සතුටට පත්වීම මනුෂ්‍යයනට කල හැකි දෙයකි.එහෙත් බොහෝ විට ප්‍රතිග්‍රාහකයාගේ වස්තු ලාභය දැකීමෙනුත්, තමා සතු වස්තුව අඩු වනු දැකීමෙනුත් අසතුටට පත් වීමට ඉඩ ඇත.

ඉච්ඡා-මච්ඡරිය නම් වූ ඊර්සියාව මසුරු කම යන කෙලෙස් වැඩි යා හැකිය. මෛත්‍රිය-කරුණාව පෙර දැරි කරගෙන දනය දෙන්නේ නම් ඊර්සියාව මසුරු කම යන නරක කෙලෙස් දුරු වී හිත පිරිසිදු වන්නේය. මේ දන කුසලයයි.

## දන සිතක්

දනය, ප්‍රතිග්‍රාහකයන් හට නිහතමානිව සහ යටහත් පහත් ලෙස පිළිගැන්විය යුතුය. එවිට සිතෙහි මානය හෙවත් උඩගුකම පහ වී යයි."හොඳ දේ කීමෙන් හොඳ ප්‍රතිඵල ලැබෙන්නේය."යන්න අදහමින් දන කටයුතු කිරීමෙන් තමා සිදු කරන කුසල අකුසල ක්‍රියාවලට ඇත්තටම විපාක ලැබේද යනාදී වූ විෂම සැක පහ වී යන්නේය.

"හොඳ දේ කිරීමෙන් හොඳ ප්‍රතිඵල නැත. නරක දේ කිරීමෙන් නරක ප්‍රතිඵල නැත. කරන තාක් දේවල් විපාක නොදී අහෝසි වන්නේය." යනාදි මිථ්‍යා මත දරන්නෝ ද සිටිති. "කම්මස්ස කතා සම්මා දිට්ඨිය" පිළිගෙන කටයුතු කිරීමෙන් මේ සියළු මිථ්‍යා මත තුරන් වී යන්නේය. දන කුසලය හා දන කුසල විපාකය මනා කොට තේරුම් ගැනීමෙන් සිත පිරිසිදු වී, සිතේ පවතින අපැහැදිලි භාවය හා නිබඳ පවතින්නා වූ මෝහය දුරු වී අමෝහ හෙවත් ප්‍රඥාව මතු වී එන්නේය. මෙය ඉතාමත් වැදගත් දෙයකි.

## පාරමී දන කුසලය

මෙහිදී පාරමී දනය ගැන කෙටි විස්තරයක් ඇතුළත් කළ යුතුය. පාරමී දනය යනු පෞද්ගලික වස්තු ලාභයක් හෝ ආනිශංසයක් පිළිබඳ අපේක්ෂාවෙන් තොරව බොහෝ දෙනාගේ හිත සුව පිණිසත්, භව දුකින් මිදීමේ තමාගේ ප්‍රයත්නයට හේතු වනු පිණිසත් යන දෙවැදෑරුම් හේතු මුල්කොට දෙන දනයයි. එලෙස උතුම් පරමාර්ථ මත පිහිටා දන් දෙන දනපතියන් දකින්නන් "මේ පුද්ගලයා මේ දනය දීමෙහි ඉතා දක්ෂයෙකි."යනුවෙන් කීර්ති නාමයකට පත්වන නිසා එයට "පාරමී දන " යැයි කියනු ලැබේ.

අනුවණ හෝ මද නුවණ ඇති පුද්ගලයා තමාට ලැබෙන ලාභ ආනිශංසයන් ගැන ම සලකා දනාදි පින්කම් කරන්නේය. සංසාර දුකින් නිවීමේ පරමාර්ථයට වඩා ලෞකික වස්තු ලාභ හා කීර්ති නාම අපේක්ෂාවන් ම ඔහුගේ අරමුණ වන්නේය. මෙලෙස කරන තැනැත්තා පාරමී කුසල් පිළිබඳ සැළකිල්ලක් නොදක්වන්නකු බව පැහැදිලිය. ඒ අනුව "පාරමී" යනු කෙබඳු පුද්ගලයෙකුගේ කටයුත්තක් ද? එනම් භව දුකෙහි ඇති දෙස් දැක, සසර කලකිරී, අනුන් කෙරෙහි මෛත්‍රී-කරුණාව උපදවා ගත් උතුම් පුද්ගලයන්ගේ උතුම් වැඩ පිළිවෙළකි.

"භව දුකෙහි කලකිරී බොහෝ දෙනා කෙරෙහි වූ මෛත්‍රී-කරුණා ආදී බ්‍රහ්මවිහාර ධර්මයන්හි පිහිටි උතුම් පුද්ගලයන්ගේ ස්වභාවය" යනුවෙන් "පාරමී" යන්නෙහි අර්ථය විග්‍රහ කළ හැකිය.

## අල්ලක් වපුරා මල්ලක් පුරවන්න.

එවන් දනයක් දීමට පෙරාතුව ම දනය දීමේ උනන්දු සිත පහළ වේ. දනය පිරිනමන අවස්ථාවෙහි දී ද සිත් ප්‍රසාදයට පත් වේ. දනයෙන් පසුද තමා කරන්නට යෙදුණු දනමය පින් කම අරමුණු කරගෙන එය සිහිපත් වන වාරයක් වාරයක් පාසා සිතේ පහන් සිතිවිළි පහල වේ. මෙකී තුන් අවස්ථාවන් හි දීම සිතේ පහළ වන සිතිවිළි ප්‍රබෝධ ජනකය. මෙයින් සෞභාග්‍යමත් සුභ විපාක ලබා දිය හැකිය.

දනය පිළිගන්නා ප්‍රතිග්‍රාහක පක්ෂයෙන් ද සම්පූර්ණ විය යුතු අංගයන් ඇත. එනම් ප්‍රතිග්‍රාහකයා රාගයෙන්, ද්වේෂයෙන් සහ මෝහයෙන් තොර කෙනෙකු විය යුතුය. වෙනත් ආකාරයකට කිව හොත් අනාගාමී හෝ රහත් හෝ බවට පත් ආර්යයන් වහන්සේ නමක් විය යුතුය. එසේ නොමැති නම් රාගය, ද්වේෂය සහ මෝහය දුරු කිරීම පිණිස සීල සමාධි ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මෙන කෙනෙක් විය යුතුය. මේ ප්‍රතිග්‍රාහකයාගේ පැත්තෙන් සම්පූර්ණ විය යුතු වූ අංගයෝ වෙති.

මෙලෙස සියළු අංගයන්ගෙන සම්පූර්ණ ජලංග සමන්නාගත දනයෙහි ආනිශංස මෙපමණ යැයි සීමා කිරීමට, ප්‍රමාණ කිරීමට නොහැකි යැයි බුදුරජාණන්වහන්සේ දේශනා කොට ඇත්තේය. මහා සමුද්‍රයේ ජල කඳ යම් සේ නොමිනිය හැකි ද, එසේම ජලංග සමන්නාගත දනයෙහි ආනිශංසද නොමිනිය හැක්කේය.

මෙහිලා ප්‍රශ්නයක් මතු විය හැකිය. එනම්, කෙනෙකු තමා සතු වස්තූන් දන් දීම නිසා වස්තු පරිහාණියට පත් විය හැකිද යන්නය. එසේ නම් ලාභයක් මොන ආකාරයට සිදු විය හැකිද? ගොවියකු තම ගොවිපොළෙහි බීජ වපුරන අවස්ථාවෙහි අහුරක් තරම් වූ බීජ ප්‍රමාණයක් වපුරයි. නමුත් ඒවා පැළ වී, වැඩී, වර්ධනය වී, ගස් බවට පත් වී, ඵල දරණ අවස්ථාව වන විට විශාල මල්ලක් පුරවන තරමට ඵල හට ගන්නේය දන කුසලය සම්බන්ධයෙන් ද මේ ලෙසටම වන්නේය.

## දන ශක්තිය

ඉහත විස්තර කළ පරිදි දනයක් දීමෙහි දී ලෝභය, ද්වේෂය සහ මෝහය දුරු වන්නේය. මෛත්‍රිය, කරුණාව සහ මුදිතාව යන බ්‍රහ්මචරිය ධර්ම නැවත නැවත පහළ වීම අනුව සිත පිරිසිදු වන්නේය. මෙලෙස දනය දීමට පෙරාතුව සිටම පිරිනමා හමාර වන තෙක්ම මෙලෙස දන සිතුවිලි වලින් සිත පිරිසිදු වීමට ඉඩ ප්‍රස්ථාව ඇත.එක විනාඩියක කාලය යනු තත්පර හැටකි. එක තත්පරයකට එක සිතුවිල්ලක් බැගින් පහළ වුවත් එය සැහෙන ප්‍රමාණයකි. මෙලෙස පැයක කාලයුලක් ගත වේ නම් ඉතා විශාල සංඛ්‍යාවක් පිරිසිදු සිතුවිලි එහි ලා පහළ වේ.

මෙලෙස විශාල වශයෙන් පිරිසිදු සිතුවිලි පහළ වීම හේතු කොට ගෙන සිතෙහි උද්‍යොගිමත් චේතනා පහළ වේ. මේ චේතනා විඥ්ඥාණයේ වාර ගණනාවක්ම ඇති වී නැති වී යන නමුත් ඒවා සම්පූර්ණයෙන්ම අහෝසි වී නොයන්නේය. එමගින් කිසියම් ශක්තියක්, බලයක් සිත තුළ තැන්පත් වන්නේය. මෙසේ තැන්පත් වන මෙම ශක්තිය නිසා පසු කලෙක සුභ විපාක ගෙන දෙන්නේ මය.

මෙලෙසටම සිතෙහි පහළ වන චේතනාවෝ ද ඇතිවී නැතිවී යන්නාහ. තද ගැම්මකින්, බරකින් යුක්තව පහළ වන චේතනා නිසා එම පුද්ගල සන්තානය තුළ විශේෂ ශක්තියක් තැන්පත් වන්නේය. චේතනාව පිරිසිදු නම් එයින් සුභ ඵල ලබා දෙන්නේය. පින්කම් යනු පිරිසිදු චේතනාවෙන්ම වන්නේය. එයින් සුභ ඵල ලබා දෙන්නේමය. පිරිසිදු චේතනා හා පින්කම් යන දෙකම එකකි.

## දනයෙන් පසුව

මෙම දන කුසලයෙන් වහා ලැබෙන සුභ විපාක හතරක් ඇත. එයින් පළමුවැන්න නම් බොහෝ දෙනාට ප්‍රිය වූ, මනාපවූ කෙනෙකු බවට පත් වීමය. තිරිසනුන් පව තමාට කෑම දෙන, කවන තැනැත්තා තමන් වෙතට එන විට ප්‍රිය මනාප භාවය දක්වති. මනුෂ්‍යයනට දීම ගැන විශේෂයෙන් කීම අනවශ්‍යය.

මෙම ප්‍රිය මනාප භාවය මනුෂ්‍ය භවයට අලංකාරයකි, ආභරණයකි, කුමන කාරණයක් නිසා ප්‍රිය මනාප භාවයට පත් වන්නේ ද යත් තමා විසින් දෙනු ලබන උපභෝග-පරිභෝග වස්තු ලැබීමෙන් අනුන් සුඛයට-සුවයට පත්වනු දකිනු කැමැත්තත්, ඒවා ලැබීමෙන් අනුන් දුකින් අත්මිදෙනු දක්නට කැමැත්තත් යන දෙකරුණ නිසාය. මෙහිලා මෛත්‍රිය හා කරුණාව ඇතුළත් ය. මෛත්‍රිය, කරුණාව ඇතුළත් නම් පෙරළා මෛත්‍රිය, කරුණාව ලැබේ මය. තමාගේ දනය ලැබූ ඇත්තා මනුෂ්‍යයකු හෝ වේවා, තිරිසනෙකු හෝ වේවා පෙරළා මෛත්‍රිය, කරුණාව ආදියෙන් කාත ගුණ දැක්වීම සිදු වන්නේය. දෙවන ආනිශංසය නම් ශාන්ත වූ සත් පුරුෂයන් දන් දෙන තැනැත්තන්ගේ ඇසුරට කැමති වීමයි. වෙනත් ආකාරයකට කියත හොත් දනය නොදෙන්නා ඇසුරු කිරීමට කිසිවෙක් කැමති නොවන්නේය. සත්පුරුෂයන් ඇසුරු කිරීමට කැමති වන්නේ දන් දෙන පුද්ගලයන් පමණි. එවන් සත්පුරුෂයන් විසින් දනයෙහි ආනිශංස දේශනා කරනු ලැබීම අනුව තමාට ධර්මය ඇසීමට අවස්ථාවක් ලැබෙන්නේය. මේ අනුව අනුක්‍රමයෙන්, පියවරෙන් පියවර තමාගේ අකුසල් වැඩී ගැඹුරු ධර්ම අසන්නට ලැබීමද දනයෙහි දෙවන ආනිශංසයට අයත් ය.

තෙවන ආනිශංසය නම් හොඳ කීර්ති නාමයක් පැතිර යෑමයි. අනුන්ගේ සුභ සිද්ධිය සලකා කටයුතු කරන ගෞරවණීය අය තමන්ගේ ගුණ කියා පෑම, තත්වය හුවා දැක්වීම ආදිය නොකරති. රටවැසියන් විසින් ම "මේ පුද්ගලයා බොහෝ දෙනාට උපකාර කරන කෙනෙකැයි" කියනු ලබන ඝෝෂාව පැතිර යෑමට ඉඩ ඇත්තේය. මෙය දන කුසලයෙහි තුන් වන ආනිශංසයයි.

හතරවන ආනිශංසය නම් කුමන සභාවකට හෝ කුමන පුද්ගලයකු වෙත හෝ වේවා යන විට සබකෝලයක් නැතිව එඩිතරව යා හැකි වීමයි. දන් නොදෙන පුද්ගලයා, අනුනට දනයක් දීමට පසුබට පුද්ගලයා, මසුරු කම නිසා පිරිසක්, සභාවක්, දනපතියන් හමුවෙහි පසුබාන්නෙහිය, සබකෝලයට පත්වන්නේය. එසේම නොපනත්කම්, අකටයුතුකම් කරන පුද්ගලයා ද පිරිසක්, සභාවක් හමුවෙහි බියගුළු වන්නේය. දන- කුසල් කරන පුද්ගලයා වනාහි කොතැනට වුවත් නොබියව යන්නේය. ඊට හේතුව තමන් තුළ මෛත්‍රිය, කරුණාව පිහිටුවා ගෙන දන කටයුතු වල යෙදීමය. ඔහු නිතර අන්‍යන්ගේ සාදර අවධානයට ලක් වන්නේය. එවිට කිසිම බියක්, සැකක් ඇති වන්නෙ නැත. මෙලෙස බියකින් හෝ සැකයකින් හෝ තොරව එඩිතරව සිටිය හැකි වීම දන කුසලයෙහි හතරවන ආනිශංසයයි.

පස්වන ආනිශංසය නම් මරණින් මතු සුගතිගාමී වීමයි. මෙලෙස දන ආනිශංසයන්ගෙන් හතරක් මේ භවයෙහි දීම ලැබෙන අතර පස් වන ආනිශංසයට අනුව මීලග භවයෙහි දී සුගතියක උත්පත්තිය ලැබ භවයෙන් භවය නිවන් දක්නා තාක් ආහාර, වස්ත්‍ර, නිවාස ආදී උපභෝග -පරිභෝග වස්තු නොඅඩුව ලබා තව තවත් සමාජ සේවා කටයුතු වල යෙදී, අනුනට උදව් උපකාර කිරීමට ඉඩ ලැබෙන්නේය.

බුරුමජාතික අති පූජ්‍ය සයාඩෝ උ පණ්ඩිතාභිවංස හිමියන්ගේ කෘතියක සිංහල පරිවර්තනයකින් උපුටා ගන්නාලදී. පරිවර්තනය - පූජ්‍ය උඩරියගම ධම්මජීව හිමි

# නිවේදන සහ නොමිළයේ පලකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

වැදගත්

✱ මෙත් සවිය පුවත් සඟරාවේ පළකිරීම සඳහා එවන සියලු ලිපි ද, දාන-ශීල-භාවනා වැඩසටහන් වලදී දායකත්වය දරණ පින්වතුන්ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අතහිත දෙන පින්වතුන්ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළ වල පමණක් ලියා භාරදිය යුතු සාමාජිකයන්ගේ දැන්වීම් නොමිලයේ පළ කරනු ලැබේ. කොළ කැබලි හා තුන්ඩු වල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබඳ වග කියනු නොලැබේ.

✱ සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා එවන කවරයේද වම් පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තිබිය යුතුය.ඔබගේ ලිපිනය ලියා දීම සඳහා භාවනා වැඩසටහන් වලදී අප විසින් ලබා දෙන ලිපි කවර වලද අංකය සඳහන් නොකරන හා වැරදි අංක සඳහන් කරන සාමාජිකයන් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සඟරාව තැපෑලෙන් නොලැබී යාම පිළිබඳව වග කියනු නොලැබේ

- සංස්කාරක -

## මෙත්සවිය දුරකථන අංක

මෙත් සවිය තොරතුරු විමර්ශනය කරන විට පරිපාලන නිළධාරී මහතා අමතන්න (0112505088, 0714-014467). එම දුරකථන වල බිල්පත් ගෙවනු ලබන්නේ මෙත්සවිය මෛත්‍රී සංසදය විසිනි. අපගේ වෙබ් අඩවිය වන www.methsawiya.org මගින්ද තොරතුරු ලබා ගත හැකිය.

මීට අමතරව සම ලේකම් වරුන් වන තුසිත දෙඹගොඩ (0777-710765) හා බී.ඩබ්.චමින්ද (දු.ක.0777-255607) යන මහතුන් ගේ පුද්ගලික දුරක්අතන අංකයන් අමතා ද හඳිසි තොරතුරු ලබා ගත හැකිය.

සංසදයේ සභාපති ආචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක (0714 800800 හෝ 0777 309385) මගින් දහවල් 12.00 ත් 1.00 ත් අතර හෝ රාත්‍රී 9.00-10.00 ත් අතර පමණක් සාමාජික අංකය හා නම පවසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදුකරන්නේ නම් මැනවි.)

### කොළඹ ජාතික රෝහලේ වාට්ටු සඳහා බුදු පිළිම සහ අසරණ රෝගීන් සඳහා අවශ්‍ය මූලික ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම

වැල්ලවත්තේ ශ්‍රී විජයාරාමාධිපති අභංගම ආනන්ද ස්වාමීන්වහන්සේගේ අනුසාසනා පරිදි පැවැත්වෙන ඉහත සත්කාර්ය සඳහා බුදු පිළිම, සුදු රෙදි, සැත්කම් වලදී අන්දවන ඇඳුම්, දත් බුරුසු හා දන්තාලේපන, තුවා, සුදු හෝ පාට සරම්, ඇඳ පෝච්චි ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමට කැමති පින්වතු එම ද්‍රව්‍ය ගරු ස්වාමීන්වහන්සේට හෝ කාර්යාලයට පැමිණ භාරදෙන්න.

### ප්‍රායෝගික අධිමානසික විද්‍යාව හා පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරීමේ දෙළොස්වන වැඩසටහන

2008.03.23 දින පෙ.ව.10.00 ට අරඹනු ලබන අතර ඒ සඳහා අයදුම්පත් 2008.03.02 දිනට පෙර භාර ගනු ලැබේ.

*ඉඩකඩ සීමිත බැවින් පළමුව*

*ලියාපදිංචි වන අය සඳහා මූලිකත්වය ලබා දේ.*

### නොමිළයේ රෝද පුටු සහ කිහිළි කරු ලබා දීම.

මෙත් සවිය මගින් අසරණ අය සඳහා රෝද පුටු සහ කිහිළි කරු පරිත්‍යාග කිරීමේ වැඩපිළිවෙලක් දියත් කර ඇත. රෝද පුටු හෝ කිහිළි කරු අවශ්‍ය අය වෙත්නම් මෙත් සවිය වෙත ලිඛිතව ඉල්ලීමක් සිදු කල යුතුය.මෙම වැඩසටහන සඳහා රෝද පුටු සහ කිහිළි කරු ලබා දී දායක වීමට කැමති පින්වතුන් හට එම උපකරණ මෙත් සවිය වෙත ලැබෙන්නට සලස්වන ලෙස මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.


### සයිට් "එන්" ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස්

SIGHT —N˜ STYLE OPTOMETRISTS

නො: 126 ඩී, හයිලෙවල් පාර, නුගේගොඩ.

(අනුලා විදුහල ඉදිරිපිට)

දුරකථන: 2854758

(සියලුම වර්ගයේ ඇස් කණ්ණාඩි අවශ්‍යතා සඳහා විමසන්න)

මෙ.ස.සාමාජිකා නෙරංජලා පීරිස්


### සුව සෙත

ප්‍රාණ/විශ්ව ශක්ති ක්‍රම මගින් සමහර රෝග සඳහා සිත දියුණු කරගත් අය මගින් රෝග සුව කිරීමේ නොමිළයේ පැවැත්වෙන වැඩසටහන් ඉරු දින වලදී ශ්‍රී විජයාරාමයේ දී ප.ව.12.00-2.00 දක්වා පැවැත්වේ. කාර්යාලයෙන් විමසා පැමිණෙන්න.


### ඉතා අඩු මිලට බිම් කට්ටි 2 ක් විකිණීමට

බැලුම් මහර නගරයට ඉතාම ආසන්නව නව නුවර පාරේ පර්චස් 14 ප්‍රමාණයෙන් බිම් කට්ටි 2 කි.පාරවල් 3 කින් වට වී ඇත. පිරිසිදු ඔප්පු, තෙකලා විදුලිය, සහිතව සියලු පහසුකම් සහිතයි.

සාමාජික අංක 3-572 දුරකථන අංකය- 0114924715

# මෙත් සවිය මෛත්‍රී සංසදය සාමාජික අයදුම්පත

(ජායා පිටපත්ද භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)

1. සම්පූර්ණ නම ..............................
2. ස්ත්‍රී / පුරුෂ භාවය................ 3. ජාතික හැඳුනුම්පත් අංකය..............................

(ජායා පිටපතක් අමුණන්න)

4. උපන් දිනය...................... 5. වයස.................. 6. ආගම..............................
7. ස්ථිර ලිපිනය..............................

............................විද්‍යුත් තැපැල(e-mail)........................................ දුරකථන අංකය..............................

8. දිස්ත්‍රික්කය...................... 9. විවාහක / අවිවාහක බව..............................
10. රැකියාවක් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර..............................

..............................

11. කාර්යාලීය ලිපිනය හා දුරකථන විස්තර..............................
12. ලිපි එවිය යුතු ලිපිනය..............................
13. ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම්

    1..............................

    2..............................

14. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර

    1 ..............................

    2 ..............................

    3 ..............................

15. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇදුම,හෘද රෝග,දියවැඩියාව,රුධිර පීඩනය,අපස්මාරය ) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර

..............................

16. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද? ඔව්/නැත.
17. එවැනි මනසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර . .

..............................

18. ඔබ විසින් සඳහන් කළයුතු මෙහිදි වැදගත්යැයි හැගෙන වෙනත් විස්තර හෝ යෝජනා /අදහස් තිබේනම් මෙහි සඳහන් කරන්න ..............................

..............................

මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.

දිනය..................... අයදුම්කරුගේ අත්සන..............................

## කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

සාමාජික අංකය..............................

තේරීම් කමිටුවේ තීරණය

. .................................... ..............................

තේරීම් කමිටු සභාපති විධායක ලේකම්

දිනය.................

සැ.යු. මෙම අයදුම් පත සමගම ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශණ/වැඩමුළු/මනස දියුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දේශණ ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම, හැඳුනුම්පත් සැපයීම, තැපල් ගාස්තු, විදුලි ගාස්තු,කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිලධාරී මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනිම සඳහා රු.1500/-ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය.(එය ඇතුළත්වීමේ ගාස්තුව රු.500/-හා වසර දෙකක සාමාජික ගාස්තු රු. 500/-x2 වශයෙනි) මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදායම් ලබන පවුල්වල අය තම ආදායම් තහවුරුකළ හැකි ලිපි ලේඛන සහිත ග්‍රාම නිලධාරීතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත්තාට පසුව කාර්යාලයට පැමිණ සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ.) කාර්යාලය සඳුද, අඟහරුවාද හැර සතියේ ඉතිරි දින 5 තුල සෙනසුරාද, ඉරිද ද ඇතුලුව සතියේ දින 5ක් විවෘතව පවති. අයදුම් කරන සෑමකෙනෙක්ම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනිමට හේතුව දැනගැනිමට අවශ්‍ය නම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය.

නිසිපරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැඳුනුම්පතේ ඡායාපිටපතක් සහ 4"x9" ප්‍රමාණයෙන් යුතුව ලිපිනය ඇති මුද්දරකවර 2 ක් සමග පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් පමණක් යොමු කරන්න.
(අයදුම්පත සමග කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ)
ලිපිනය-ගරු ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයරාමය, පෙම්රිකා පාර, කොළඹ 6. දුරකථනය 011-2505088 0714-014467

# 2007-10-21 දින මිරිසවැටිය සලපතල මළුව ප්‍රතිසංස්කරණ කටයුතු නිරීක්ෂන චාරිකාව
















මෙම චාරිකාවේදි ආගමික වතාවත් අවසන් කොට ආධාර මුදල් විහාරාධිපති හිමියන්ට බාරදිමෙන් අනතුරුව දෙවියන්ට භාර භාර ඔප්පු කිරිමත් සිදුකෙරුනි. සංචාරක මගපෙන්වන්නෙකුගේ සේවය ලබාගේන අටමස්ථානය පිලිබදව සාමාජිකයින් දැනුවත් කිරිමක්ද සිදුකෙරුණි. වැඩි විස්තර ඇතුල්පිටුවල.......

## 2007-10-07 දින කදුබොඩ සුමතිපාල අනුස්මරණ ආරණ්‍යයේ දි පැවති දන සිල භාවනා වැඩසටහන.












පූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අතින් රෝගී තත්ත්වයෙන් දෙපා ඉවත් කර ඇති සුමංගල හිමියන්ට රෝද පුටුවක් පරිත්‍යාග කිරීම.



හර්නියා ශල්‍යකර්මයක් සිදු කිරීම සඳහා විජේරත්න මහතාට රු.20,000 මුදලක් අනුබුදු තුමන් විසින් පිරිනැමීම.



පූජ්‍ය පාද අඟලකඩ සිරිසුමණ හිමිපාණන් විසින් ධර්මගවේෂී මධ්‍යස්ථානයේ දී ධර්ම දේශණාය පැවැත් වීම. 2007-07-01





අධිමානසික විද්‍යා 11 වන වැඩසටහනට සහභාගි වූවන්, අලුත්ම පරිඝනක කට්ටලයක් මෙත්සවිය සඳහා පරිත්‍යාග කල වගයි.

ශ්‍රී

11 වන කණ්ඩායම භාවනා වැඩසටහන අවසානයේ දී මෙත්සවිය සඳහා තිරයක් පරිත්‍යාග කිරීම. (Multimedia Projector Screen)

